# පරණපුස්කොළ පොත

හෙවත්

# සිව ආදිපාද චරිතය.

---

මි ණු ව න් ගො ඩ

මැඩෑමුල්ලේ

ඩී. ඇස්. ජයසේකර

වි සි න්

ප්‍රබන්ධකොට

ප්‍ර සි ද්ධ ක ර ණ ල දී.

කො ළ ඹ

විද්‍යාදර්ශ යන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

1910.

# ශුද්ධපත්‍රය.

| පිට. | තීරය. | පෙළ. | වරද. | නිවරද. |
|---|---|---|---|---|
| 1. | 1. | 29. | පොතුඝැර. | පොතුහැර. |
| 6. | 1. | 33. | වල්ලග. | වල්ලභ. |
| 7. | 1. | 13. | සමමන. | සම්මාන. |
| 7. | 2. | 24. | හෙතුකොව. | හෙතුකොට. |
| 8. | 1. | 30. | පිදුලි. | විදුලි. |
| 20. | 2. | 7. | සවසිරි. | සව්සිරි. |

# පරණ පුස්කොළ පොත.

## ප්‍රාරම්භ කථාව.

### නගරවර්ණනාවක්.

සිංකල ශ්‍රී භාර ධාරිත පාරි
ශුඬියෙන් ලඬකා නමැති ප්‍රවරො
ත්තුංග නාමොපලක්‍ෂිතවූද සෛං
හලිය අපහට ජම්මභූමිව සිංහල
ද්වීපයයි ප්‍රකටවූද ඉන්දීය සාගරගත
මුතුඇටයකැයි විචජ්ජනයන් වි
සින් වණ්ණිතීය ශ්‍රීසාර විරාජිත
භූමණ්ඩල මණ්ඩනායමාන මෙම
දිවයිනෙහි හස්තිරූප ලක්‍ෂණනු
පෙන ගිරිශිඛරාන්තයෙහිවූ බැ
වින් හස්ති ශෛලපුරයයි නම්ලත්
පුරප්‍රවරයෙක්විය. වර්තමාන කා
ලයෙහි කුරුණෑගල යන නමින්
ව්‍යවහාරවූ මේ නගරයවූකලී නා
නා දිශාවන්හි පැතිර ගිය වීථි
පඬක්තීන්ගෙන්ද වැව් පොකුණු
ආදී නිර්මල ජලතලාවන්ගෙන් හා
යන්ත්‍ර විද්‍යාවෙන් සමුපලක්‍ෂිත දුම්
රියෙන්ද යාන වාහනාදී නානා
දෙයින්ද ආශ්‍රිතවූවා අතිශය ප්‍ර
ශස්ත භාවයට පැමිණියාය. සහස්‍ර
සංඛ්‍යාත ප්‍රාසාදයන්ගෙන් සහ එහි
හැසිරෙන සියදහස් ගණන් ජන
තාවගෙන්ද සමෘඬවූ මේ නගර
යෙහි දරිද්‍රයන්හට වාසස්ථාන ලැ
බීම පවා දුෂ්කරවූ හෙයින් එහි විසූ
**එලියෙස් අප්පූ** මැනභාගයෙහි ය
ථොක්ත නගරයට නුදුරුවූ පොතු
ශැර සුලු ගෙයක් නිර්මිතකොට
ගෙන එහි වෙසයි, ප්‍රථමයෙන්
වෙළෙළදෙක්ව සිටි හෙතෙමේ දි
ළිඳු බවට පැමිණිකල වත්කම් මද
වූයේ කෘෂිකර්මයෙන් යෙදී රැ
කෙන්නේය. උහුගේ විසිවයස්පිරි
දියණියක්වූවා. **ඔලැසිසා** නම,
**ජයසේනය, බාරොන්ය** යන දෙ
දෙනෙක් ඈ කෙරෙහි ඇලුම්වූහ.
වරින්වර එම තරුණයෝ දෙදෙ
න එහි පැමිණෙති. **ජයසේන**
ජාත්‍යාලයෙහි යෙදී සිටින ඥාන
වන්තයෙකි. ඔහුට පෙම්බරියගේ
**ලැසිසා** යන නාමයද රුචිතො
විය. එහෙත් **බාරොන්** පරසිරිතට
වැඩි ආලය ඇත්තේ ඇගේ නම
ටද ඇඳුම් ආයිත්තම් ගැණද විශෙ
ෂයෙන්ම පැහැදී වැඩියක්ම
ඈදර ඇතිවිය. මෙපරිද්දෙන්
**ජයසේන** සමග පැවති ඇගේ
ආලයද තුනීවිය. දිනක් **ජය
සේන** එහි අවුත් සිටි වේලේම **බා
රොන්ද** එහි පැමිණියේය. ඔහුට
වාඩිවීමට පරණ හාන්සි පුටුවක්
තුබුවේය. එහි අතුරණුලැබූ මෙට්
ටය යට ලිකොටයක් මෙන් යමක්
තිබී ඔහු මෙට්ටයට යටින් අත
බහා ඒ ඉවතට ගෙණ "මේ මොන
ජරාවක්දැ"යි ප්‍රශ්න කොළේය.
**ලැසිසා** මැණියන්ට කථාකොට

“අම්මේ, පුස්කොල පොත් කබල ‘ගුදිරිය’ යටට කුමට දැම්මෙහිද? එය අතටගෙණ අර කී වචන නො ඇසුනාද? කසලගොඩට වීසි නොකර එය මෙසේ තිබීමෙන් අපට අත්වූ ලජ්ජාව කෙතරම්ද”යි සමච්චල් දෙඩුවාය. **බාරොන්ද** ප්‍රේමියගේ වචන අසා ඉතා සතුටුව “එය පරණ මන්ත්‍ර පොතක්වත් දෑ”යි කියා පොතේ වැස්ම විදහා කවී පොතක් බව නොදැන වාක්‍යයක්මෙන් කවියක් කියවන්ටවන. **බාරොන්** සාමාන්‍යයෙන්ම කියවීමෙහි අදක්ෂයෙකි, පුස්කොල පොත්හි අකුරු කිසිසේත්ම භාවිතා නොකළ බැවින් ඔහුට එය කියවිය නොහී ඉතා ලජ්ජාවක් ඇතිවූ නුමුත් ඒ කිසිවෙකුටත් නොහඟවා මේ කැත පොත්කබල කසලගොඩටම කැපකිරීමට මමද සතුටුවෙමි”යි වැදූවත් ඉදිරියේ කොලොම්බු ලන්නාසේ **ජයසේන** ඉදිරියේ බොරුවියත්කම් හඟවා පුරසාරම් දෙඩුවේය.

මේ කථාව අසාගෙණ සිටි **ජයසේන** එතරම් කියවිය නොහැකිවූද ගණං කරන්නාවූද මේ පරණ පුස්කොල පොත මටද බලන්ට දුනමැනවැයි කියා ඉල්වාගෙන එහි පළමු කව කියෙව් වහාම පොත පිළිබඳව මහත් අභිලාසයක් ඉපිද මෙය මේ පිරිසට ඉතා කැත පොතක් මෙන් වැටහී යන නුමුත් මේ ඉතා ගරුකටයුතුවූද මාහැඟි ප්‍රයොජන ලැබියහැකිවූද පුස්තකයක. එහි නමක් නැති නුමුත් ප්‍රකාශවන දෙය කිමෙකැයි මම විසඳා බලමි. දැන්කාලේ පරංගි, ලන්සි, ඉංග්‍රීසි ආදී කැත නම් දරණ සංකරයන්ගේ පටලැවිල්ල දෙස බලනකල මේ නමක් නැති පරණ පොතෙන් ඒ පර නම් දරණ සංකරයන්ට යහපත් උපදෙශ ගතහැකි බව මට පෙනීයන්නේයයි කීය. පොත මඳක් දුර පෙරළා බැලූකල විමලා නම් කුමරිය **ලෑසීසා** ලෙසද පියතිස්ස තමා ලෙසද **බාරොන්** සීව ලෙසද ඔහුට පෙනීගියේය. එයින්ද මේ පොත ගැණ වැඩි විස්තර දැනීමට සතුටුව ඒ ඉතා ආසාවෙන් කියවන්ට වන්නේය.

**එලිසෙස්** ඉතා ගරුකරණ මේ පොතට **දියණියසහ බාරොන්** කළ නිගාවද ඔහු කිසි කලෙකත් මතක නැති නොකෙළේය. **ජයසේනගේ** බුඩියද ජානාලයද **එලිසෙස්ට** අවබොධවී ඔහු කෙරේ බෙහෙවින්ම සතුටු වූයේය. එසේම **බාරොන්** කෙරෙහිද ඉතා අප්‍රසන්නාවිය. තවද ඔහුට මෙසේවූ සිතෙක් විය. මා දියණිය කෙසේ නුමුත් **ජයසේනට** සරණ පාවාදෙමි. එසේ කල ඇගේ පරසිරිත් ආසාව මගහැරෙමින් ඇ ආයුශ්චාරිත්‍රාභිවර්ධනය නිපදවායයිද නිශ්චය කෙළේය.

ඔහු මෙසේ සිතත් සිතත් **ජයසේන** සුබොච්චාරණය, ස්වරපරිවර්තනය, ආදී කියවීමේ නියම රීතියට අනුව කර්ණරසායනයව කියවන්නාවූ ඒ මධුර කාව්‍යයන් කන් යොමා අසාගෙණ සිටියේය. **ලෑසීසාද** පර සිරිතට බලවත් ආසා ඇත්තී වුවද ඒ මධුරවූ වෘත විශෙෂයෙන් කියනු ලබන්නාවූ කාව්‍ය

රසාශ්වාදනයෙහි ඇලුනී, එයින්ම පෙම්වත්හු කෙරෙහි විශෙෂ ඇල යක් ඉපදවූවාය.

මෙසේ **ජයසේන** විසින් නමක් නැති පුස්කොල පොත කියවීම හේතුකොට ගෙණ **ලෑසිසාද** ඇගේ පියහුද **ජයසේන** කෙරෙහි අතිශයින්ම ප්‍රසන්නවූහ. කල්‍යාමෙන් **ලෑසිසා බාරොන්** වෙත ඇල්ම අඩුකරන්ටද ඔහු වෙතෙහිම ආලය වර්ධනය කරන්ටද යෙදී කෙලවර ඕ තොමෝ **ජයසේන** ගේ බිරින්දවූවාය. මෙයට අසහාය හෙතුවූයේ නමක්නැති පුස්කොල පොත්හි කව් **ජයසේන** විසින් නියම රීතියට කියවද්දී ඒ වාග්රසය කෙරෙහි **ලෑසිසාගේ** ආලය වර්ධනය වීමෙන්ය.

"පලහ **සරඟ** බිඟුජලවර මත
වර ණ
රැ**ඤද** ගඳට රස පහසට
දෙවති ප ණ"

වන මෘගයා ශබ්දය කෙරෙහි ආශාවෙන් ප්‍රාණය පවා නැතිකර ගන්නාකල **ලෑසිසා** ශබ්දයට ගිජුව නිරවද්‍ය මාර්ගයක ගමන් කොට යහපතක් සලසා ගැණීම කෙතරම් අරුමයක්ද? ඒ අනිකෙක් නොවෙයි. මේ පරණ පුස්කොල පොත්හි ආනුභාවමැයි. **ලෑසිසා** පොත් කබල කසල ගොඩට වීසිකරන්ට යයි කියා පියාණන්ගේද නියම පෙම්වත්හුගේද සිත් කෙලෙසු නුමුත් ඒ දෙපලගෙන්ම වැඩි ප්‍රයොජන ලැබීමටද එම පොතම ඇට ප්‍රතිඥාධාරවූ බැව් පෙනේ. ඒ එසේමැයි:— උත්තම වසතුහු (උතතමයෝ). තමන් විනාශකරන සතුරන් කෙරෙහිත් කුළුණු පතුරුවා සෙත්වැඩ කෙරෙත්මය, චන්‍දනහරයවූකලී මඩනා කල්හිද සිඳිනා කල්හිද සුගන්ධය වහනය කෙරේමය. වෘක්ෂයතෙමේ ඡේදන අවසථාවෙහිපවා තමා සිඳිනා සතුරා කෙරෙහිද සෙවන තොම හකුළුවා. එපරිද්දෙන්ම පැරණි පුස්කොල පොතද විනාශකාරී **ලෑසිසාටම** සානන සුඛය අත්කරණ ලද්දේවිය. තවද මෙය අසනබලන සියල්ලෝම යමක් ගර්හාකර ඉවත දමන්ටහෝ ප්‍රශංසාකොට ලංකරගැණීමට හෝ ප්‍රථමයෙන් ඒ පිළිබඳව නිසියාකාර විභාග කටයුතු බැව් මතක නැති නොකෙරෙත්වා.

**ජයසේනද** මේ පුස්කොල පොත හෙතුකොට ගෙණ **එලිසන් අප්පුගේ** එකම ප්‍රිය දියණිය සරණ පාවා ගෙන ඔහුගෙන්ද ලබනලද උපකාර ඇතිව මහත් යසසට පැමිණි බැවින් මේ අරුම පුදුම ප්‍රශස්ත පුසතකයට බොහෝ ගරු බුහුමන් කරන්ට වන්නේය. මේ පොත ලියවා අවුරුදු අසූවක් පමණ කල්ගතවූ පසු **එලිසන්ට** ලැබීතිබේ. "කවර කලෙක කවරෙකු විසින් රචනා කරණ ලද්දක්ද"යි නිශ්චය කිරීම උගහට වුවත් මෙය පාලි ගාථා පොතක් බලාගෙන පිළිවෙලින් සිංහලට පෙරලා කවිකර තිබෙන බවද 'ඔලුපැලියාවේදී ලියනලදී' යන්නක් දකින්ට ලැබුන බැවින් එය සත්කෝරලයට අයත් වන්නිහත්පත්තුවේ ඔලුපැලියාව බවද නො අනුමානවම කිවහැක.

**ජයසේන** (අභිනව) ග්‍රන්ථ සොධක කර්තෘහුගේ දයාබර මිත්‍රයෙක් විය. "පොදු ජනයාට ප්‍රයොජන ගතහැකි ග්‍රන්ථයක් වශයෙන් මේ පොත සකස්කොට අතරින් පතර පරණ පුස්කොල පොත්හි කාව්‍යයන්ද බහා පිළියෙලකර දුනමැනවැ"යි ඔහු ග්‍රන්ථ කර්තෘගෙන් අයැද සිටි බැවින් මෙය මෙසේ මහජනයා ඉදිරියේ තබන්ට විය.

මෙතැන් සිට පරණ පුස්කොළපොත්හි විස්තරය අසා බලා හිස්මුව විනාශ කළ කරනවැමියාගේ අස්ථානයෙහි නොලා අනොන්‍ය කර්තව්‍යයන්හිදී වැ පොරෝ මෙන් සලකා ස්ථානොචිතව මින් ප්‍රයොජන ලබත්වා.

වර්තමාන කාලික ප්‍රාරම්භ කර්තෘව මමතොකිත් නම්යේය.

# පරණ පුස්කොල පොත

හෙවත්

**සිව ආදිපාද චරිතය.**

## 1 වෙනි පරිච්ඡේදය.

## සුමන සහ සිරිමතී.

ශ්‍රී බුඩවර්ෂයෙන් එක්දහස් තෙසිය දෙසැත්තෑ වැන්නෙහි සිරිලක සේසත් නැගූ දප්පුල මහීපාලයාණන්හට සිත් කළුවූ වෙරළු මිණියෙන් අලංකෘතවූ බැවින්දෝ බෙරමිණිපායයි නම් ලත් පුරප්‍රවරයෙක්වූවා. ශක්‍රදෙවෙන්ද්‍රයාගේ වෛජයන්ත ප්‍රාසාදය හා සමකල හැක්කාවූ ඒ මහීපාලයාණන්ගේ රාජමාලිගයෙන්ද සහස්‍ර සංඛ්‍යාත සිවුවර සෙන්පති මහ ඇමති ආදීන්ගේ ප්‍රාසාද සමූහයන්ගෙන්ද බබලන්නාවූ මේ රාජධානි තොමෝ තව්තිසා දෙව්ලොව ඉන්ද්‍රපුරය මෙන් මුළු ලක්දිවට නායකවූවාය.

එකල ඒ තෙවන දප්පුල නරශ්‍රෙෂ්ඨයාණන්ගේ මයිලණුවූ සුමන නම් ක්‍ෂත්‍රිය වංශිකයෙක් එහි මහා ප්‍රාසාදයෙක්හි වසන්නේය. ආදිපාද වෙශයෙන් කල් යවන්නාවූ ඔහුගේ ධනයද ගුණකීර්තනායද මුලු ලක්දිව්හි පතළහ. ඒ මහා ආදිපාද තෙමේ ඓශ්වර්යයෙන් ඊශ්වරයා හා සමවූයේ ස්වකීය හස්තයම කල්පද්‍රැමයක් කෙළේ බෙහෙවින්ම දන මන තුවන් පෙළඹවී. රත්නත්‍රයාති ප්‍රසන්න අචල ශ්‍රද්ධාබුද්ධි සම්පන්න හෙතෙමේ ලක් සසුන් සෙමෙහි තබා රක්නේ උදාරවූ රාජ රාජ මහාමාත්‍යාදීන්ගෙන්ද යටත් පිරිසෙයින් ගොපල්ලන් ආදීවූ නිවටයන්ගෙන්ද එකහෙලා ආදර බුහුමන් ලබන්නේ ඔහුගේ සුමන යන නාමය අන්වර්ථ නාමයක්ම බව ලාඞ්කිකයන් ලවා සතතයෙන්ම කියවී.

(පරණ පුස්කොල පොත්හි)

**බෙර මිණි පාය.**

සියලු මෙලක තුළ පෙර දින
මහ පාය
බැබලූ සත් රුවන් දනැතිව
නෙක පාය
වෙරලූ මිණි ලකල දප්පුල
රද පාය
නමලූ එයින් සිරිසර බෙර
මිණි පාය

### සුමන ආදිපාද.

නි රි ඳු තෙවන දප්පුල බෙර
මිණී පා ය
ස බ ඳු කුලද ගණනකි එකි
නෙක පා ය
එ ර ඳු සුමන නම් මයිලනු
ඇ පා ය
මැ ති ඳු සිරින් වැජඹිනි දන
මන පා ය

ඒ සුමන නම් ආදිපාදහට සිරිමතී නම්ලත් රාජකාන්තාවක් මෙහෙසීවූවාය. ඕ තොමෝ පංච කල්‍යාණයෙන් වොරජනා විශිෂ්ට රූපත් කාන්තාවක්වූවා මනාගුණ යෙන්ද සමන්විතව දුටු දුටුවන් ප්‍රියකරන්නී ජාම්බෝනද කනක යෙන් මවාලූ විචිත්‍ර රූපයක් මෙන්ද අගණ් ශිඛාවක් මෙන්ද එකසේම බබලන්නී එකල සිටි සකල වනිතාවන්ටම නායක වූවාය.

### සුමන සිරිමතී බඩ ප්‍රේමය.

සු ම න මෙ ඇ පා රූසිරි
මන බැ න් ද
සු ගු න ස රූ පා සිරිමති
පියො බ න් ද
ලැ බු න ම නා පා ලෙසනිති
සැප ක න් ද
දෙදෙන නු රා පා සිටි
උපමා කි න් ද

අතිශයින්ම ප්‍රකාශී දීප්තිමත් දෙහසම්පන්නව සිරිමතීය යි ප්‍රකට ඒ මෙහෙසි තොමෝ වල්ලභයාණන් හා එකාවත් දැක්මෙන් සතුටුව රන්රසසේ දෙහෝ නොහොත් සඳලපසේ යෙදී ලෞකික සැප අනුභව කරන්නී දෙවත ජීවිතය අධිකවූ කාමාවචර සෞඛ්‍ය සංසිඩියෙන් රඤ්ජිතවැ පරනිම්මිත වසවර්තීත්‍යාදී සුර සුන්දරියක්හා සමවූවා බෙහෙවින්ම ප්‍රීතියෙන් ප්‍රමුදිතවූවාය

---

## 2 වෙනි පරිච්ඡේදය.

### ශිව.

මෙපරිද්දෙන් සමහන් සැප අනුභව කරණ සිරිමතී කල්‍යාමෙන් දුරක ලක්‍ෂණ ඇත්තී කම් රසෙහිද නොලගණවූවාය. ඒ මෙහෙසියට අනුක්‍රමයෙන් මෙසේ දොළදුක් ඇතිවිය. ඕතොමෝ පළමුවර කපුගල් නගරයෙහිවූ හෙල පියුම් ගෙන්වා හිස පැළඳ ක්‍රීඩා කිරීමට අභිලාසවූවාය. ආදිපාද සාණන් සුහුසුලුව ගෙන්වා දුන්නුමුත් ප්‍රිය දෙනිනිය නොපැළඳ ඒ පුෂ්ප ක්‍රීඩායෙහි ලජ්ජා ඉපදවූවා. සිරිමතී දෙවනවර පුලසති නගරයෙහිවූ නීලොත්පල පුෂ්ප පිළන්දනයට ප්‍රලොභවූවා සමුණනන් විසින් දක්නාලද්දී එයද ගෙන්වා දුන් නුමුත් පුෂ්පයන් ඉවතලා කුසුස් සිතින් සවල්ප කාලයක් ගතකළාය. ඕතොමෝ තදනන්තරව යුධ සරඹ දශීනයටද යුධායුධ අත ටගෙණ ක්‍රීඩා කිරීමටද අභිලාසවූවාය. එකල දප්පුල මහරජාණන්ට සිව්රඟ සෙන් අට

සැට දහසෙක්විය. ඒ මහා යුද්ධ සේනාව දිනක් බෙරමිණිපා මහ මලුවෙහි රැස්කරවා ඔවුන්ගේ යුද්ධ පෙළපාලි දර්ශනයට සිරිමතී අභිලාසවූ බැවින් ආදිපාද තෙමේ එපවත් මහරජාණන්ට දන්වන ලදුව සියමෙහෙසිය අදහස ලෙසම එයද ඉෂ්ටකරවූහ. එදින රැස්වූ යොධභටයන්ගේ යුද්ධ ශිල්පයෙහි නිපුණ තාවය දුටු සිරිමතී ප්‍රීතියෙන් ඉල්පැගියාක් මෙන් ඔද වැඩී ඔහු සියල්ලටම බත් වියදම් දෙවා බෙහෙවින් සත්කාර සම්මාන කළාය. ඕතොමෝ නැවතත් පොළොන්නරු නුවරින් ගෙන්වනලද මහනෙල්මල් පැළදීමට අභිලාස ඇත්තී සමාදරයෙන්ම යථොක්ත පුෂ්ප පිළන්දනය කොට බෙහෙවින්ම ප්‍රීතියෙන් ප්‍රමුදිත වූවාය. දාසි දස්සන් ආදී අනන්තවූ පරිවාර ජනයාගෙන් ගරු සත්කාර ලබන සිරිමතී මෙපරිද්දෙන් දරු ලකුණු ඇත්තී දසකඩමස් පිරී පුත්‍ර රත්නයක් ලැබූවාය. එහෙත් ඇගේ පූර්වකර්මයක් ද්‍ය හෝ ඒ ප්‍රශව සමයෙහිම ඈ බිහිරි සන්නි නමැති භයානක රෝගයකින් පෙළී මරුමුවට පත්වූවාය.

### සිරිමතිගේ දරු ප්‍රශවය.

ස පි රි දස එකඩ මස ඇය
රැති යෙ දු වා
නි මි රි ගෙට පැමිණ පිතුරුව
නෙක වැ දු වා
මි හි රි සියල සැප ගතකළ
ලෙස වි දු වා
බි හි රි සන්නි නම් රෝගයක
වැළි දු වා

### සිරිමතී ජන්මාන්තර ගතවීම.

ස ත ර පරතෙරට පත්
වෙදුදුරුන් උපා
නි ත ර කළ නමුත් නෙක
පිළියම් ඈ පා
ප ත ර බල යුතුව සිටි
රුදු කාම පා පා
න ත ර කළ නොහී ඇය
විය මරුට කැපා

සුමන ආදි පාදයාණෝ අති ප්‍රසිද්ධ වෛද්‍යවරයන් ලවා බෙහෙවින් ප්‍රතිකාර කරවන ලද නමුත් ඉන්කිසි ප්‍රතිඵලයක් නොලැබ සිදුවූ සියමෙහෙසියගේ මරණයෙන් ශොකාතුරවූයේ දයාභරිත සුන්දරිය සිහිපත් කරන්නාක් මෙන් පිත් රුවනට "ශිව"යයි නම්කොට අත්‍යාදරයෙන් වර්ධනය කළහ.

මෙසේ කිරිමවුන් යොදා දරු වඩනා ඒ ඇපාණන්ට කල්යාමෙන් බලවත් රොගාන්තරායයෙක්විය. වෛද්‍යයන්ගේ දක්ෂ භාවය හෙතුකොට ගෙණ ජීවිතය ලද නමුත් එයින් ඇපාණෝ අන්ධ වූහ. රොගයෙන් බෙලහීන නැනැත්තෝ සකල ඉන්ද්‍රියයන්ගේ විකලත්වයෙන් යාම් ඊම් ආදිවූ ඉයෑපථයන්හිද රිසිසේ යෙදිය නොහැකිවූහ. ප්‍රියාඞ්කාවගේ මරණ දුක්ඛය හෙතුකොට ගෙණ අභිභවනය කරණලද චෛතසික බලයන්ගේ ඌනත්වයෙන් මේ බිහිසුණු රොගය ආදිපාදයාණන්ට වැළඳි බැව් එකල සිටි අති දක්ෂ වෛද්‍යයන් විසින් එකහෙලා පිළිගන්නාලද්දේවිය. තමන්ගේ ජර

පත් ස්වභාවය හෙතුකොට ගෙණ පුත්‍රයා වැඩීමට බාධාවිය හැකිදෝ හෝයි සිතූ හෙතෙම් "ස්වාමි පුරුෂයා කළුරිය කළ බැවින් එකල වැන්දඹුව අනාථව කපුගල් නුවර සිටි ස්වකීය නැගණිය ඇගේ ළදරු දියණිය හා එහි ගෙන්වා නැගණිය දරු මිදදෙන රැකබලා ගැණීමෙහි යොදවා සියළු වියදම් දෙවා අතලස්ව වසතුව සුරැකිව තුබූහ.

ඒ ඇපාණන් සතුධනය සෙමෙහි තබණලද මහත් භාණ්ඩාගාරයෙක්විය. හේ අතිසමර්ථ යාන්ත්‍රිකයන්ලවා නිර්මිතකළ ආශ්චර්යමත් යතුරු බැඳුම් ඇති මහත් යදෞරකින් පිහියන්තේය. කිසිසේත් චෞරයන්ට ගතනොහෙන ලෙස යන්ත්‍ර විද්‍යාවෙන්ම සමුපලක්ෂිත කොට සියලු වැඩ නිමවා සුවර්ණ රජත මණිමුක්තාදිවූද මිලමුදල් ආදීවූද සියලු සාරධනය එහි පුරවා තුබූහ. ඒ භාණ්ඩාගාරයෙහි යදෞරවූකලී ඇපාණන් නොදන්නාලෙස කිසිවෙකුට කිසිකලෙකත් හැරීම හෝ පියවීම කළ නොහැක්කේමය. ඒ අරුම පුදුම යන්ත්‍ර බන්ධනය යදමකින් ඇපාණන්ගේ සයනස්ථානය හා සම්බන්ධවිය. විදුලි ධාරාවන් නිපතනය කරණලද ඒ යදම් කෙළවර මිණි (ගෙඩ)යක් ආලම්භනය කරණලද්දේවිය. දෞර හරින පියනකල්හි "ටාන්" යන අනුකරණයෙන් හඬදෙන්නාවූ ස්වකීය කර්ණාසන්නයෙහි අවලම්භිත ඒ මිණියවූ කලී සුවචකීකරු දාසයෙකු පරිද්දෙන් දූතමෙහෙවරින් ඇපාණන් සතුටුකරන්නේවිය. ඉඳින් කෙස්ස (යතුර) ගෙන යමෙක් මේ දෞර විවෘත කිරීමට තැත්කළ නමුදු එහි යන්ත්‍රමය යදම ක්ෂණයෙහි නාදදෙවමින් ඇපාණන්ට දන්වයි. ලිපිකරු අය කැමි ආදි කිසිවෙකුට හෝ දාසිදස් ආදීවූ ගෘහයෙහි අන්‍ය පරිවාර ජනයෙකුටවත් ඇපාණන් නොදැන දෞරහැරීම පියවීම කළනොහැක්කේමය.

## විශ්මය ජනක භාණ්ඩාගාරය.

1

සලකා පිතු රු ව න්
ගබඩාව පිසිතු රු ව න්
මිලමුතු මිණි රු ව න්
පමණ නැති විලසටම පි රු ව න්

2

සොරුදන විසු රු ව න්
නට නොම තබා සු රු ව න්
කැඳවා යතු රු ව න්
කෙළේ ගැබ්ගෙය බෙලෙනි

3 සරු ව න්

විසින් නැණ දැ රු ව න්
හැරිමුත් මෙදෞර මු රු ව න්
කළවිලස සු රු ව න්
වැසේසිය බලයෙන් යතු රු ව න්

4

ගෙදරසිටි උන්ව ත්
මෙදෞර නියමින් හැරිය ත්
යතුරුදම හඬ දෙ ත්
එයින් දැනගනි සුමනසිරි ම ත්

සුමන ආදිපාදයාණෝ ස්වකීය අක්ෂිනෙත්‍ර යුග්මය නැවත ලැබූවාක්මෙන් සිතා පින්රුවනද නැගණියන් දියනිය (යෙහලණිය)ද මෙසේ අත්‍යාදරයෙන් සතතින් වැඩූහ.

# 3 වෙනි පරිච්ඡේදය.

---

## විමලා සහ පියතිස්ස.

සුමන ඇපාණන් සෙවනෙහි මෙසේ වැඩෙන ස්වකීය පුත්‍ර සීව කුමර සොළ සැවිරිදි විය පැමිණි කල ඇපාණන් යෙහෙලණියවූ **විමලාද** තුදුස්වස් පිරී දෙදෙනාම අනඟසිරි පරදවන මනා රුවින් දුටුදුටුවන් මනනුවන් ගත්හ. එකල විමලා කුමරිය මව් (ආදිපාද යාණන්ගේ නැගණිය) සර්පයෙකු විසින් දෂ්ටකරණලද්දී විෂවේග යෙන් පීඩිතව ජන්මාන්තරගතවූවාය. ඈ එකල සිටි අතිසමර්ථ විෂ වෛද්‍යයන්ගෙන් අනන්ත ප්‍රතිකාර ලැබූ බැවිද මෙය සාමයික කාලමරණයක් බැවිද පුස්කොළපොත්හි කව් අටකින් එකහෙලා වර්ණනා කරණ ලද්දේය.

දල්වනලද ප්‍රදීපයෙක ප්‍රක්ෂේපකරණලද තෛලය යම් කලෙක්හි ඌනත්වයට පැමිණේද එකල්හි තෙල් උකාබී පිය නොහිසිටි කඩ වැටිය වහ්නිජ්වාලයෙන් විනිර්මුක්තවන්නේමය. ඒ වහ්නිජ්වාලය මිලියෙමින් අනුක්‍රමයෙන් අතුරුදන්වන සුලුවුවත් මාරුත යෙන් පහරනු ලදහොත් වහාම ක්ෂයවන්නේය. එසේම පුත්‍ර තෛලයාගේ ඌනත්වයෙන් සිටි ප්‍රදීපායමාන සිටු දූ නොමෝ සර්ප විෂ නමැති මාරුතයෙන් අවිරත ලද්දී ජන්මාන්තරගතවූවද ඒ පුත්‍රයාගේ අභාවයම පාමොක්වන බැවින් සාමයික කාලක්‍රියාවටම යටත්වූවාය.

ඇපාණෝ යෙහෙලණිය පිතුට කැපසරුප්ලෙස කාරබන්ධනයට පමුණුවා ඔවුන්ගේ අභිවර්ධනය සලසමැයි සිතා ඒ පිළිබඳව දෙදෙනාම ගිවිස්වාගෙණ දැහැමින් කල්යවත්නාහු මැතභාගයෙහි අයවැය සම්බන්ධ සියලු ලෙඛන තැබීමෙහි පියතිස්ස නම් කුමාරයෙක් යෙදූහ.

සීව පියාණන් අදහස මෙනෙහිකර එය කඩකලහොත් මහත් නපුරකැයි සිතා විමලාට ගිවිසුම්බස් දුන් නුමුත් විමලා කෙරෙහි නොපහන. හෙතෙමේ යුධ ශිල්පයෙහි ඇලුම්වූයේ රහසිගතව සේන මහරජාණන් සෙනාධිපතිහු ආශ්‍රයකරන්නේ නොබෝ දිනකින් කඩුසරඹ ආදිවූ සකල කලානිධියෙහි තත්පරවූයේ ලාඞ්කික යුධ පෙලපාලියෙහි අතිදක්ෂවූහ. කල්යත් යත් සීව තෙමේ නිර්භීත පුරුෂබල පරාක්‍රමයෙන් යුක්තවූයේ තැන් තැන ඇවිද කෙළිදෙලෙන් සිටියහ. හෙතෙමේ තමහට තරම් නොවන ගමන් යාමෙන්ද බොහෝසේඅයුතුවීයදම්කිරීමෙන්ද තුරුණුවියෙහිසිටි තැනැත්තෝ ක්‍රීඩා පරිහාසයෙන්ම කල්යවන්නාහු පියහු අවවාදයෙහිද නොලග්නවූහ.

විෂමාචාර සම්පන්නයකුගේ ලීලා සංදර්ශන සමුපලක්ෂිතවැ සිටි උහු කෙරෙහි විමලාද නොපහන. ඒ එසේමැයි: කලපුව් මුහුදු වතුර ලබන්නී නොසිඳී පවත්නීය. යම්සේ කලපුනොමෝ ප්‍රියාදරහු නමැති මහාසාගරවෙතින් සෙනෙහොදකය නොලබාද එකල උදක

යෙන් විනිර්මුක්තවූවා වියලීයන්නීය. එපරිද්දෙන්ම විමලා සීවගෙන් සෙනහොදකය නොලද්දී දයාසිලිලෙන් තුනීවූවා මෙසේ සීව කෙරෙහි නොලග්නවූවායි හඟිමු.

සුමන ආදිපාදයාණන් ලිපිකරුවූ පියතිස්ස වනාහි ක්ෂත්‍රිය වංශික කුමරෙක්මවිය. මව්පිය දෙදෙන දිළිඳුව සිටියදී උපන් හෙතෙමේ එකල සුමන ආදිපාදයාණන්වෙත ලිපිකරුව සිටි නුමුත් මනාගුණවත් ශ්‍රුතසම්ප්‍රයුක්ත පුත්‍රරත්නයෙක. එබැවින් විමලා උහුකෙරෙහි ඇලුම්වූවාය. ලිපිකරුද කරුණුනොබලා අස්ථානයෙහි මෙන් ඈ කෙරෙහි සිතුපහදවා සිටි නුමුත් පසුව තනයය දැන "අන්‍යයන් හා කාරබන්ධනයට ගිවිස සිටි ඈකෙරෙහි ඇතිකළ ඇල්ම අතියම් බැව් සිතා" ඒ බව ඇටද අවබොධකරවා දෙදෙන සමසිතින් දුකින් මෙන් ආදර ඉවසා කල්කළහ.

සීව නොයෙක් සෙල්ලම්හියෙදී බොහෝ වියදම් කිරීමෙන් ධනය විනාශකරනබැව් දැනගත් පිය ආදිපාද තෙමේ දුක්වී "පුත්‍රයාටබෙහෙවින්අවවාදකළහ. නැවතත් තොප ක්‍රීඩාපරිහාසයෙන් කල්කළහොත් මාසතු ධනය තොපට අහිමිවනලෙස යොදමිය"යි කියාද තර්ජනය කළහ.

එහෙත් සීව තෙමේ නොබෝ දිනකින්ම පියහු අවවාදය නොතකා අනුරාධපුර වෙතගොස් මිත්‍ර සමූහයා රැස්කොට ගෙණ කෙළිදෙලෙන් මහත් මුදලක් නැතිකළහ. උහු එසේ සෙල්ලමින් කල් යවා පසුදින ගෙදරට පැමිණ ආහාර අනුභවයෙහි යෙදී සිටියදී යම්කිසිවෙක් එහි අවුත් හසුනක් පැවේය. ඒ දුටු ලිපිකරු තෙමේ දූතයා අතින් හසුන්පත ගෙණ සීව කුමරුට දැක්විය. හෙතෙමේ වැය පත බලා චින්තාශවාදයක් නැත්තාක් මෙන් වහා පිළිට වැද සුසුම්ලමින් සිටියහ.

**සීව දුක්වීම. ***

1

"ඔහු දූතයා අ ත
තුබු පත සීවහට දෙ ත
සීව ඒ දැක සි ත
සොවින් මැලවී ගියේ සියව ත

2

අහර කිස සැලැකි ලි
නැතිව ඔහු පිළිවැද දැ ළි
අතින කරමින් රැ ළි
දුකින් සිටි බැව් හැඟී ගියක ලි"

මෙසේ ආහාර කෘත්‍යයෙහි සැලකීමක්නැතිව රැවුල අතින් කරකවමින් කල්පනාවෙන් සිටි සීව වෙත ලිපිකරු පැමිණ අදහස පරීක්ෂාකරන්නේ මිත්‍රයාණනි, "මේ ප්‍රස්ථාව මට ඉතා දුක්ඛ දායකවිය. බලවත් උවමනාවක් බැවින් දෙමව්පියහු වෙත යැවීමට මසුරන් අටලොසක් දුනමැනව"යි කියා දුක්ඛ ස්වරූපයක් පෑලා සිටියේය. සීව තෙමේ "මට සිදුවූ විපත කිමෙකැයි නොදැන මේ කියන බස් යකඩ දැගිය ගෙයි පූළුන් ඉල්වන්නාක් හා සමවන්නේය, මිත්‍රයා මේ ප්‍රස්ථාවේදී මාගෙන් මුදල් ඉල්ලීම

* උචිතස්ථානයන්හි යථාවකාශයෙන් බහාලන මේ කව් පරණ පුස්කොළ පොතින්ම උපුටාගත් බැව් සැලකිය යුතුයි.

නොවටී, පියහු අවවාදය නො ගෙණ බොහෝ වියදමෙන් සෙල් ලම් කෙළෙමි, ඒ නිඳැළියෝ මා ගෙන්ම කකා මවෙත දැන් එව් වැ යපත මෙන්න, මෙයින් මසුරන් සූසතළිසක් ඉල්වනබැව් පෙනේ, මම ඊට කටයුතු උපාය නොදන ලතැවිල්ලෙන් සිටිමි"යි මහත් දුකින් කීය.*

## සීව පියතිස්සට පිළිතුරුදීම.

1

"මිතුර මේ කිමකැ යි
නොදන කී බස් අයුතු යි
යකඩ දැගිය ගෙ යි
පුළුන් ඉල්වනු ඔබට සෑහෙ යි

2

පියහු අණ නොත කා
කෙළෙම් සෙල්ලම් අනෙ කා
මාගෙන් උන් ක කා
එවූ වැයපත මෙදැන් හනි කා"

යළිත් මෙය රහස් වශයෙන් සිත තබවයි කියා මිත්‍රයාට අවවාද කරණ කලම සීවගේ දෙනෙතින් කඳුලුධාරා නික්මෙන්ට වන. ඒ දුක්ඛ දයක සවරූපය දුටු ලිපි කරුතෙමේ උහු කෙරෙහි අනුකම් පාකොට මිත්‍රයාණනි, "භාණ්ඩාගා රයෙහි උවමනා තරම් මුදල් ඇත. පියහු වෙත පැමිණ එතුමා පාවැද ඔබ්බෙහි කිසිසේත් සෙල්ලම් නො කරන්නෙමැයි ගිවිස්වා ඇපාණන් කමවා ගනගොන් මුදල් ලැබීමට බැරිනොවේය"යි කීය. එබස් ඇසූ සීව තෙමේ "මපියාණන්ගෙන් එසේ මිල ලැබීම හෝ එතුමන් වෙත පැමිණීම හෝ මේ ප්‍රසථා වේදී මට කළ නොහැක. ගෙදර සියල්ල උන් නිදිගත්කල ගබඩාව තුළට වැද මුදල් ගෙණවත් මෙ යින් නිදහස් වෙමැ"යි හෙතෙමේ සොරසිත් ගත්හ. මෙපරිද්දෙන් සීවතෙමේ පියහු නිදිගත්කල සෙ මින් සෙමින් ගබඩාවවෙත පැමිණ යතුරු නළ උපායෙන් ඉවත බහා කොස්ස ගෙණ දොර හැර නැවත යතුරු නළ සවිකර තබා ඇතු ළට වන්හ. පිටතට සම්බන්ධකළ යන්ත්‍ර දමය නොමැතිකල මේ වා රය විවෘතකොට අතගත් කෙණෙ හිම නැවත පිහියන්නේය. එබැ වින් යන්ත්‍ර දමය නැවත අගුල හා සම්බන්ධ කොට සීව කුමරු ගෙට වන් බව සැලකිය යුතුයි.

එකල චෞර අදහස් දැනීමෙහි දක්ෂවූ පියතිස්සතෙමේ සීව පසු පස්සෙන් ඒ දැනගන්නා පිණිස ගියේය.

## පියතිස්ස විසින් සොරු පරීක්ෂා කිරීම.

"එකල පියති ස්සය
සොරු මන සෙවුම් ද ස්සය
සීව පසු ප ස්සය
ගියේ ඒ දැන ගන්න රි ස්සය"

පියතිස්ස එහි පැමිණ "දොර හැර ගබඩාව තුළට වැද සිටි සීව දැක කලබල කරුණු කිමෙකැ"යි ප්‍රශ්න කරමින් ඔහුද ගේතුළට වන්නේය.

මෙසේ දෙදෙන ගෙයි සිටි යදී සීවගේ කලබලය හෙතුකොට ගෙණ අතපය වැදීමෙන් තෙමේම දොර පියවී ක්ෂණයෙන් අගුල්වැටී ඇපාණන් වෙත යන්ත්‍ර දමයෙන් ශබ්දය ගියේය.

---

* කවි දෙකෙන්ද මේ අදහසම පැනේ. අන්‍ය සියලු තැන්හිද මෙසේමැයි.

පිටත සිට කෙස්සෙන් දොර අගුල් හැරිමුත් ඇතුළට වන්න උන් මින් පිටවනු නොහැකි බව ප්‍රත්‍යක්‍ෂ කරන්නාක්මෙන් ආශ්චර්‍ය්‍යාද්භූතචාරය අගුල්වැටී පිහී ගියේය.

**අරුම පුදුම දොර සියවීම.**

"පිටත සිට යතු රෙන්
හැරිමුත් යමෙක් මෙදො රෙන්
පිටවනු බැරි හො රෙන්
පුදුමයටමෙන් වැසුනි එවැරෙන්"

සුමන ඇපාණෝද "සොරු බඩු ගණිතැ"යි යන ශඞ්කාවෙන් යෙහෙලණිය හා සමග හිනින් බැස බිම් මහලෙහිවූ ගැබ් දොර වෙත ගියහ.

පියතිස්ස තෙමේ "ස්වකීය මිත්‍ර සීව කුමර එකලට විමලා හා සරණවීමට ගිවිසගෙණ සිටි බැවින් මෙයින් ඊට බාධා පැමිණේතැ"යි සිතා මිත්‍රයාණනි, "ඇපාණෝ යෙහෙලණිය සමග හිනින් බසිනා අඩිගැස්ම ඇසෙයි, ඔබ පියහු දූත් කිසිසේත් කමා නොවෙති, විමලාද ඔබකෙරේ නොපහදිදී, 'මත් තෙහි මෙවැන්නක් නොකරමි'යි කියා සහතික කළහොත් අදට ඔබ නිදහස් කරන්නෙමැ"යි කී. එය නොඅදහා ඇඟ ගැහි ගැහී සිටි සීව අභිමුඛයට පත් පියතිස්ස ළෙහි අත පැහැර දළ සොවින් ප්‍රතිඥා දෙන ලෙස නැවතත් අයැදි සඳ උහුද එබස් පිළිගෙණ "මත් තෙහි කිසියම් දුසිරිතක් නොකෙරෙමි"යිසහතිකකරදිව්ලහ. එකෙණෙහිම ඇපාණෝ යෙහෙලණිය අතගෙණ හිනින් බැස එහි පැමිණ බියෙන් බියව දොර හැර බැලූහ. මේ ප්‍රස්ථාවෙහිදී යතුරු නළින් කළු යම්කිසි අයොමය ආයුධයක් විමලා අතෙහි ඇතිවිය. මහත් අසිපතක් සුරත ධරා සිටි ඇපාණෝ සොරු සිටීත්ද කව්ද කිම්දැ"යි විමලාගෙන් ප්‍රශ්න කළහ. එකෙණෙහිම විමලා පහන් එළියෙන් ඔවුන් දැක හැඳින ඔවුන් කෙරෙහි දයා ඉපදවූවා ස්ථානොචිත ප්‍රඥවෙහි යෙදුනී කිසිත් පිළිතුරු නොදී ශබ්ද නගා හඬන්ට වන. ඇපාණෝ "සුකුමාර දෙහ සම්පන්න යෞවනියක් බැවින් සොරුගෙන් බියව හඬන්නිය"යි සිතා සොරු ගෙයි සිටියදීම දොර අගුලු ලාවස්වා වහා පුතණුවන් සහ ලිපිකරු එවනලෙස එහි ගියහ. ප්‍රස්ථාවොචිත උපාය දන්නා විමලාද යතුර අතටගෙණ "මයිලණුවන් දුර්වල බැවින් එහි යාම උචිත නොවේ, මම ඔවුන්ට යතුරදී ප්‍රවෘත්තිය දන්වමි, ඔබ යහන වෙත ගිය මැනව"යි ඇපාණන් අත ගෙණ එහි ගොස් සයනය කිරීමට සලස්වා ඉන්පසු ඔවුන්ගේ සයනාගාර වෙත යන ආකාර දක්වා නැවතත් හිනින් බැස භාණ්ඩාරයටගොස් දොරහැර ඔවුන් දැක නොසතුටුව "යස සොරහු දෙදෙනෙක් අද දැනගතිමි, කරුණු වහා නොකිවහොත් ගැහැටවේය"යි සැලකළා.

**විමලාගේ තර්ජනය.**

"යස සොරහු දෙදෙනෙ ක්
අද දැන ගතිමි මෙලෙස ක්
කරුණු මට විනස ක්
නොකිවවත්තෙමැයිකී වෙහෙස"

එබස් ඇසූ පියතිස්ස කරුණාවන්ත කුමරියනි, "අපහට දැඩිවූ වධබන්ධන නොදේවා, අප නොපෙළාවා. යම්කිසි කරුණක් සඳහා මම මුදල් සවල්පයක් ලැබීමට මෙහි පැමිණියෙමි, මා ගබඩාවට පත්වූ බැව් දැන ඒ පරීක්ෂාවට සීව මෙහි අවුය. දෙදෙන ගෙයිසිටියදී අගුල්හී දොර පිනීගියේය. එබැවින් මම වරදකරුවෙමි, කමාවුව හොත් යෙහෙකි, හෙට උදයම මම මින් පිටව යන්නෙමි, ඒතාක් මා නොකෙළිහා මට අනුග්‍රහ කළ මැනව"යි කීයේය.

**පියතිස්සගේ දුක්මුසු ආයාචනා**

1

"මා ගෙයි තුළ වැදූ ත
බව දැන සීව අවුදි ත
මෙහි වන් කල දෙදෙ ත
වැසී ගියමුත් මෙදොර නිතැති ත

2

වරදකරු වෙමි ම ම
සමාවුවහොත් එකදි ම
පසුවදා උදය ම
නොදෙනු යනතෙක් රුදුරු
සොර නම"

විමලා එබස් අසා අතිශයින්ම කෝපව උහු දෙසවත් නොබලා "උඹට යස වැඩ කරවමි, නිසි දඬුවම් දෙවන්නෙමි, මෙයට ප්‍රථමත් උඹ මුදල් සොරාගත් බැව් නොදනිම්දැයි බැණවැදී උඹ එසේ වහාම පලා නොගියහොත් රජුවෙතට පමුණුවා නිග්‍රහ වධ බන්ධන කරවන්නෙමැ"යිද කීවා.

සීව තෙමේ විමලාගේ රළු බස් අසන්නාහු තමානිසා මිතුරුතුමාට කරන්නාවූ නිග්‍රහයෙන් දෙනෙත්හි කඳුලු පිරී ගියෙමුත් ආත්ම රක්ෂාව පරමාර්ථ කොට ඒ ඉවසා සිටගත. ඉන්පසු විමලාද නින්දට ගියා. ඒ දෙදෙන ඇපාණන් වෙත පැමිණ "විමලා කී කෙණෙහිම අපි ගබඩාව වෙත ගොස් දොර හැර පරීක්ෂා කෙළෙමු. එහි කිසිවෙක් නොසිටියහ. ඇතුළට වැද භාණ්ඩාදිය පරීක්ෂාකෙළෙමු, කිසිවකුත් නොඅඩුව සම්පූර්ණ ලෙසම තුබුහ"යි කීවෝය.

මේ ප්‍රවෘත්තිය ඇසූ ඇපාණෝ "සොරු පැනගියහ"යි සලකා නැවතත් නිදාගත්හ.

පියතිස්ස "විමලා සමග කී ලෙසම" පසු දින උදය සියලු කෘත්‍ය සම්පාදනය කොට තබා ඇපාණන් වෙත පැමිණ ස්වාමීනි, "අප දෙමව්පියහු මා කැඳවති, කුමක් බවත් නොදනිමි, එබැවින් පොළොන්නරු පුර දෙගුරුන් වෙත යාමට සමු දුනමැනව"යි කියා ඔබගෙන් සමුගෙණ අනතයෙහි "මා ගියපසු කුලයෙහි කෘත්‍ය බාහුල්‍යත්වයෙන් නැවත මෙහි ඒමටද අවකාශ නොලැබේය"යි දන්වා දළ සොවින් යන්ට වත්නේය.

සීව තෙමේ "කෙළිසෙල්ලම් නොකරමි"යි කියා ප්‍රිය මිත්‍රයා සමග කළ ගිවිසුම ලෙසම කල් යවන්නාහු උහු අනවරතයෙන්ම සිහිපත් කළාහුය. පියහු වෙතද බැති සිත් උපදවා සුවච කීකරුව කෙළිසෙල්ලම් අත්හැර යෙහෙන් කල්කරණ හෙනොමේ විමලා කො

රෙහි අල්පමාත්‍රයෙක්ද නොපහන් නාහු පොළොන්නරු පුරට ගොස් සේන මහරජාණන් සෙන්පතිහු ආශ්‍රය කරමින් ලකිසුරුගෙන් දිවෙල් ලැබූහ. යුද්ධශිල්පයෙහි අති දක්ෂවූද එයටම අභිලාසවූද හෙතෙමේ මෙසේ එයින්ම රැකෙන් නාහු මැනභාගයෙහි ඒ මහීපාලයාණන්ගෙන් සෙනෙවිකම් ලබා එහිම වසන්නාහු යුද තුනකින් ජය ග්‍රහණය කොට ඒ සේන මහරජාණන්ගෙන් ගරුබුහුමන් ලැබූහ.

මේ අතර සුමන ආදිපාදයාණෝ පියතිස්ස නොමැත්තෙන් අතිකෙක් ලිපිකරුකොට ගෙණ යෙහෙලණියන් හා සමග බෙර මිණිපා මහා ප්‍රාසාදයෙහිම වසන් නාහු වරින්වර පුතණුවන්ගෙන්ද උපස්ථාන ලබන්නාහ.

**සීවගේ ලාඞ්ගික ජයග්‍රහණ.**

"යුද තුනකින් දි නා
ලබා බුහුමන් නර නා
පොළොන්නරු වස නා
සීව සෙන්පති බැබලි තෙදි නා"

මෙසේ කාල්යන අතර දිනක් යම්කිසි කරුණක් සඳහා සීව සෙන්පතිහු පියතිස්සගේ ගෙදරට පැමිණිකල පියතිස්ස මිත්‍ර සන්වය පෙරදැරිකොට උහුට ආදර බුහුමන් කළහ. දෙදෙන පිළිසඳර බස් තෙපලීමෙන් පසු සීවතෙමේ මිත්‍රයාගෙන් ලත් අනන්තවූ අවවාද උපකාර සිහිකොට "මේ මාගේ මිත්‍රයා විමලා වෙතෙහි ආලයෙන් සිටි බව දනිමි, දැන් ඒ කාන්තාව මොහුට ප්‍රිය භාර්‍ය්‍යාව කරවීම හැකිවෙයි, මපියාණන්ට එසේ දන්වමි"යි සනිටුහන් කොට වහා පියාණන්වෙත හසුන් පතක් යැවී.

**ඒ හසුන මෙසේයි:-**

මාලෙහිවැඩූ දයාබර පියාණනි,

ඔබවහන්සේගේ අදහසලෙස විමලා කෙරෙහි මාසිතු නොඇලේ. මට අභිප්‍රාය බිරින්දක් මම දෙවනු ලබමි මහවාසලින් මට ලැබෙන ආදායමද ඉතා බොහෝය. ඔබසතු ධනය විමලාට හිමිකර ඈ පියතිස්සට සරණපාවා දුනමැනව, විමලාද ඊට සතුටු වෙතැයි මම බලාපොරොත්තු වන්නෙමි, ඔබවහන්සේ මාගැණ නොසිතුව මැනවි;

මෙවගට,
ඔබවහන්සේගේ අතිජාත
සුවචකීකරු පුත්‍ර
**සීව.**

සුමන ඈපාණෝ පුත්‍රයාගේ හසුන ලැබ කියවා බලා උහු සිටි යදී ධනය අන්සතු කිරීමට අසතුටු වුවත් විමලාගෙන් ලැබිය හැකි විපුල සඞ්ග්‍රහයන්ද සලකා ධනය ඔවුන්ට හිමිනොකොට එයින් ඔවුන්ගේ ජීවිත වෘත්තිය ඉටු කරගැණීමට පමණක් බලයදෙවා ඈ සරණපාවා දෙවන්නෙමැයි සිතා හසුන විමලාට පෙන්වා ඈගේද සතුට දැනගත්හ. විමලා මේ ගැණ ඉතා ප්‍රසන්නවූ නමුත් එදවස් භාණ්ඩාරයට වැද සිටියදී ඈ පියතිස්සට කරණලද අවමානන අපවාද සිහිකොට දැරියනොහෙන තරම් චිත්තසංවෙගයට පත්ව මහත් හයින් කල්ගත කළාය.

සීව සෙන්පතිහු නැවත මිත්‍රයාට හසුනක් යවා උහු ගෙන්වා "පියහුවෙත යවනලද හසුන පිළිබඳ කරුණු දන්වා එයට පිළිතුරු ලත් කෙණෙහිම අප දෙදෙන බෙරමිණිපා ගොස් මිතුරු තුමන් කෙරෙහි විමලා පවත්වන කෝපය දුරුර තත්වාවබොධයෙන් ඈ සතුටුකරවා එන්නෙමි" යි පියතෙපුල් කීහ. හෙතෙමේ එසේ පියහුගෙන් පිළිතුරු ලැබ පියතිස්ස සමග එහි ගොස් සිදුවූ පවත් නොවලහා විමලාවෙතෙහි දක්වා ඈ පියතිස්ස කෙරෙහි පහන්වූ කල නැවතත් පොළොන්නරුවට ප්‍රවිෂ්ටවූහ.

සුමන ඈපාණෝ පුතණුවන් බස් ලෙස පියතිස්ස කුමරහට විමලානම් යෙහෙළණිය සරණපාවාදී තමන්සතු ධනයෙන් රැකීමට බල දුන්හ.

මෙපරිද්දෙන් නියමයට එකඟව ඔවුන් වැඩූ ආලය අභිමතාර්ථ සාධකව උතුන් සඳලපසේ එකඟින් වැස ඒ ජයම්පතිකාවෝ ශ්‍රී සම්පත්තියෙන් දියුණුවූහ.

---

# 4 වෙනි පරිච්ඡේදය.

## මෙත්තා කුමරිය.

සීව සෙනාධිපතිහු මෙපරිද්දෙන් පිය සන්තක සියලු ධනය සහිතව බාල්‍යයෙහි පෙම්බැඳ සිටි විමලා නමැති සුන්දරිය ප්‍රිය මිත්‍රයාහට නැප සරුප් ලෙස සරණපාවා දෙවා සේන මහරජහු ආශ්‍රය කරමින් පොළොන්නරු පුරම විසූහ.

එසමයෙහි පොළොන්නරු පුර තිස් කෙළක් වස්තුඇති නන්ද නමැති සිටු පුත්‍රයෙකුගේ කුලයෙක්විය. ඒ නන්ද මහ සිටුහු සුරෙන්ද්‍රයා හා සමාන වස්තු ඇත්තේ පූර්වෝක්ත සුමන ආදිපාදයාණන්ගේ ජ්‍යෙෂ්ඨ සහෝදරීවූ සුගලා නම් ක්ෂත්‍රිය කන්‍යාව සරණපාවා ගෙණ සමහන් සැපවිඳින්නාහු මෙත්තා නමැති දූ රුවනක් ලබා දැඩි භක්තියෙන් වැඩූහ. ඒ කුමරිය තෙලෙස් වස් පිරිසඳ දෙමහල්ලෝ පෙරකම් ලෙස ජන්මාන්තර ගතවූහ. එකල මෙත්තා කුමරියගේ සුළු පියහු අයකැමිව ඒ මහත් වස්තුව සහ කුමරියද රජ අණ පරිදි රක්ෂා කෙරෙයි.

## අයකැමිහු මෙත්තා කුමරිය රක්ෂාකිරීම.

"එකල රජ පණ තය
අයකැමි බලා විප තය
නොවන ලෙස වෙන තය
නොසිතමින් රැකි දනද එකතය"

ඒ රූපශ්‍රීයෙන් බබලන සුවිනීත උත්තමාවෝ නානා ශිල්ප ශාස්ත්‍ර දන මෙත්තා නමින් ප්‍රකටවූවාය. සුචරිතයෙන් අගනැන් පත්ව සිටි බැවින් පංචකල්‍යාණයෙන් සමලංකෘතවූ ඒ කාන්තාව උර්වශී නම් දිව්‍ය ගනිකාව හා සමාන කිරීම යුතු නොවන්නේය. ඈගේ රූපශ්‍රීය ප්‍රමාණකර දනගනු කැමැත්තන්ට සමුණාතන්ගේ ප්‍රේම බන්ධනය ප්‍රමාණ වන බැවින් ඈගේ රූපාලංකාරය විස්තර

නොකරම්, එයින් කිසිවෙක් අසතුටු නොවෙත්වා

### මෙත්තා කුමරියගේ යෞවන අවස්ථාව.

1

"රුසිරෙන් දිසි ඉ     තා
මෙකුලගණ සුවිනී     තා
සිප් සත් දූන මෙ     තා
නමින් පලිවී දෙසෙනි අන     තා

2

කලණ පස පු     න් තා
එකත උරුවිසි වැ     න් තා
කිව නොනිසි ව     න් තා
සුසිරි අගතැන් පැමිණ උ     න් තා

3

ඇගෙ රුසිරු පම     ණා
කරණු තුටුහට සම     ණා
බැඳුනු රග පම     ණා
එයින්නොකියමි නොවනුනොම"

යටකීසේ පොළොන්නරු පුරවාසයකරන්නාවූ සීව සෙන්පතිහු මනා රූ යුත් මෙත්තා කුමරිය දැක බෙහෙවින් සතුටුවූහ. ඕතොමෝද උහු කෙරෙහිම ආදර සිතී හෙතෙමේ මෙත්තාගේ නිවාසයෙහිම ලැගුම්ගත. ඒ දෙපලගේ අවශ්‍ය බන්ධුත්වයම එයට අසහාය හෙතුවූයේය. කල්යාමෙන් දෙදෙන උනුන් තත්වය විශෙෂයෙන්ම දැනැදින ආලය වඩා විවාහිවිස චින්තාසන්තොෂයෙන්ම කල් ගතකළහ. එකල මෙත්තා අසුන් විහිදවීම (අශ්ව ශිල්පය) මනාව දැන එහි පරිචිතවූවාය. ඕතොමෝ අසුන්පිට යාමෙහිද දක්ෂවූවා අනෙකවිධ සත්‍ව ශික්ෂණයෙහිද නිපුණවූවාය. කැකුළු අසුන් යොදනලද රථාරූඪව අනවරතයෙන්ම වීථිසංචාරණයෙහි අභිලාස ඇත්ත් එබඳුවූම බියකරු ගමන් යන්නී දුටු දුටුවන් මවිතකළාය.

---

## 5 වෙනි පරිච්ඡේදය.

### පඬිරට යුධය.

සීව සෙන්පති තෙමේ මෙත්තා කුමරිය හා ප්‍රිය විශ්වාසයෙන් මෙසේ මදකලක් පසුවෙත අතර ඒ මිත්‍ර සත්‍වයාගේ පරමාර්ථ ප්‍රයොජනය නොලැබම ලඞකාශ්වරම හිපාලයාණන් අණින් මහසෙන් ගෙණ යුද පිණිස පඬිරට ගියහ.

පරාජි හවනයෙහි කෘතහස්තාවූ තෙජොබල පරාක්‍රමයෙන් දසනුදෙස පතළ සත්කීර්තිධර ඒ සේනාධිපතිහු නැව් සැටෙක නැගි මහසෙන් සහිතව ගැඹුරු මහසයුරු මැද ගමන් ගත්තාහු දස දිනක් යාත්‍රාකොට පඬිරටකරා පැමිණ ගොඩබට තැන් පටන් ඉදිරියට වන් වන් සතුරන් සාධමින් අනුක්‍රමයෙන් ගොස් "සතුරු රජ ගණුම්හ"යි මදුරාපුරවටලාගත්හ. එහිදී මහත් යුධයක්කොට සිය දහස් ගණන් පඬිරට වැසියන් මරා අගල පව්රු මැඩ හැස්වා ඇතුළු පුරට වැද සතුරු පඬිරජ මැරූහ. ශෙෂවූ සතුරු පිරිස් හිස්ලූ ලූ අත දුවන්ධවත. සෙන්පතිහු මෙසේ ජයග්‍රහණයකොළේ පඬිරට මුලුල්ල තෙදකින් පතුරුවා ලක්දිව් තෙලෙහි නරශ්‍රෙෂ්ඨයාණන්

වෙතින් පිළිසරණ සොයා සිටි පඬි කුමරහු ගෙන්වා ධවලච්ඡත්‍රානංචා මහොත්සවයෙන් උහු සිංහාසන ප්‍රාප්ත කොට උහුගෙන් ලත් අනන්තවූ සත්කාර සම්මාන විද සිය සෙනගට මනා සඞ්ග්‍රහයන්ද කරවූහ.

මෙපරිද්දෙන් එහි කිහිප දිනක් වාසය කරන්නාවූ ඒ මහා සෙනෙවි තෙමේ පළමු සේන නිරිඳු දවස ලක්දිවින් පඬින් විසින් පැහැරගෙණ ගොස් තුබූ සවණ්ණ පිළිම මණිමුක්තාදී අනර්ඝ වස්තුතාක් මුලුල්ල ඒ ඒ තැනින් ගෙන්වා රාශීභූත කොට ස්වකීය නරශ්‍රෙෂ්ඨයාණන්ට අභිනව අභිෂෙක ප්‍රාප්ත පඬි රජහු දුන් පඬුරු පාක්කුඩම්ද ගෙණ නැව් නැගී මහ මුහුදු තරණයෙන් ජන්ම භූමිය කරා ආ ගමනයකොට මාන්තොට්ටමින් බැස රාජධානිය වෙත ප්‍රවිෂ්ටවූහ.

පරශත්‍රු මර්ධනයෙහි නියැලි ගාම්භීර ප්‍රතාපාලඞ්කෘත ත්‍රිසිංහලාධිපති ජගධීශ්වර මීපචක්‍රවර්ත්ති වූ ඒ දෙවන සෙන් මහරජහුද "සෙන්පතිහු යුද දිනා මහසෙන් ගෙන ගරු බුහුමනින් එත්ය"යි පරම්පරා ශබ්දයෙන් අසා දත්තාහු පෙර ගමන්කොට උහු අත්‍යාදරයෙන් පිළිගත්හ.

අභිමතාර්ථ සාධක කීර්ත්ති තෙජොප ශොභිත චින්තා මාණික්‍යයක් බඳුවූ ඒ මහා සේනාධිපතිහුද ගෙණෙනලද සියලු වස්තූන් වෙන වෙනම එරජු වෙත පිළිගැන්වූහ. එයට අති ප්‍රසන්නවූ කෘතඥූපකාර සච්චරිතාභිවර්ධිතිය සාධුගුණ කරුණා විශෙෂ ඇති ඒ මහීපාල තෙමේ උහු ලක් උපරජයෙන් පුදා බොහෝ නාන්න මාන්න දෑසිදසුන් දෙවා සඞ්ග්‍රහ කළහ. මෙසේ ශ්‍රීලඞ්කාවීපයෙහි යුවරාජ පදවි ලත් ඒ භීම වික්‍රම පුරුෂ බල පරාක්‍රමයෙන් දෙශ දෙශාන්තරයෙහිදු පතළ සත්කීර්ත්තිධර ප්‍රබල ශත්‍රු කුඤ්ජරනිකර නිරාකරණයෙහි කෙසරිඤායමානවූ මහා සෙනාධිපති තෙමේ ඨානාන්තර ප්‍රීතියෙන්ද රජුගේ අභිප්‍රාය ලෙසද කිහිප දිනක් මහවාසල වෙනම ලැගුම් ගත්හ.

එකල මෙත්තා කුමරිය සෙන්පතිහු කෙරෙහි සෙනහ සිද පෙරළී ගියහයි රට මුලුල එක කොලාහලවිය. ඒ එසේමැයි:– මේවූකලී ස්ත්‍රීහු නම් චපලයෝය යන ධර්ම පදයාගේ ප්‍රත්‍යක්ෂභාවය දක්වන්නාක්සේ විය. කපටයෝද එකල නොසිටියාහුමයයිනොසිතියයුතු. මහසෙන් පතිහු මෙපවත් අසා ඒ කාන්තාව පරීක්ෂාකරනු සඳහා එහි ගියහ. මෙත්තා සෙනාපතිහු එන්නේයයි දැන මෛත්‍රී සහගත නුවූවා වහා රියනැග රුචිවූ දෙස යන්ට වන. සෙන්පතිහු කුමරිය නොදැක ගියගමන්ද පරීක්ෂා නොකොටම ඒ ගැණ කිසිත් නොසිතා අනුරාධපුරයෙහි තමන් ප්‍රියමිත්‍රවූ මහා වෛද්‍යාචාර්‍ය නැන දැකීමට උවමනාවක් ඇති බැවින් එහි ගියහ.

# 6 වෙනි පරිච්ඡේදය.

## ගුප්ත කාර බන්ධනය.

මහසෙන්පතිහු වෛද්‍යාචාර්ය්‍යතුමාගේ නිවාසයට එළඹ එතුමා දැක සතුටු සාමීචි බස් තෙපලන්ට වන්හ. පිළිසඳර කථාවෙන් පසු වෙදැදුරු තුමා සොත්ථි ශාලාවෙහි සිටින මරණාසන්න ස්ත්‍රියකගේ විස්තරයක් මෙසේ මහසෙන්පතිතුමාට ප්‍රකාශ කළේහ. ඈපා කෙනෙක් සමග විවාහ බස් ගිවිසසිටි තරුණියක් රථයකින් වැටී හස්ත පාදාදී අවයවයන් කැඩී බිඳී මගෙන් ප්‍රතිකාර ලබමින් මරණාසන්නව සිටින්නී වෛද්‍යාචාර්ය්‍යොත්තමය, “මා පෙම්වත්හු සමග කාරබන්ධනයට ගිවිස සිටි නුමුත් කපටයන්ගේ කෙටවිලි බසින් ඒ වෙනස්ව දූන් බලවත් දුකින් පෙළෙමි. මගේ මරණය මෙයින් නියම බැවින් ඉන්පසු මා සතු ධනය කපටයන්ට නොව මා පෙම්වත්හටම හිමිවන ලෙස සලසා තබන්ට සතුටිමි, එබැවින් මා සමග කාරබන්ධනයට නිස්සෙක්ද වාසල ලිපිකරු සහ පෙරවි බමුණාද මෙහි වහා කැඳවා දූත මැනවි. මා හා කාර බන්ධනයට සතුටුව පැමිණෙන අයට මසුරන් දහසක්ද ඔබතුමාට පන්දහසක්ද දෙන්නෙමි, ඉතිරි ධනය ප්‍රේමවන්තයාට හිමිකර මියයන්ට ලැබුනි නම් ඒ මට මහත් සැනසීමකැ”යි කියනලද්දීය.

(මේ කාලයේදී ධනවන්ත තරුණියක් කාර නොබැඳ මළ කල ධනය ඥාතීන්ට හිමිවන ලෙසද කසාද බැඳ දරුවන් නොලැබ මළ කල ධනය ස්වාමිපුරුෂයාට හිමිවන ලෙසද රාජසම්මතයෙක් විය. එසේම තරුණියක් කාර බන්ධනයට ඇතුළත්වන තෙක් ඈ සතු ධනය පිළිබඳව ඈට රුචිවක් කළ නොහැකි ලෙසද පෞරාණික ව්‍යවස්ථා ලක්දිව්තෙලෙහි පතලව තුබූ බැව් පෙනේ. එබැවින් පූර්වෝක්ත කාන්තාව ධනය පිළිබඳව රුචිවක් කිරීමේ අභිලාසයෙන්ම මරණාසන්නයේදී කසාද බැඳීමට යත්නකළ බැව් සැලකිය යුතු.)

“ඈගේ මේ වචන ඇසූපසු ඈට මරණය වහා පැමිණෙන බැවින් ප්‍රතිඥදී ඈ සනසා ආමි, දැන් එයට නිස්සෙක් සොයන්නෙමි”යි කීය.

සෙන්පතිහුද “එබඳු කටයුතුවලදී මැලි නොවන නිර්භීතයෙක් බැවින් වැඩිදුර කථා නොකරම එයට මම සතුටුවෙමියම්හ”යි ගිවිස එහි ගියහ.

ඒ කාන්තාවද “තව ස්වල්ප කාලයකින් මා දිවි නැසෙයි, එබැවින් මට මොහුගෙන් කාරිය කිම්දැ”යි උහු දෙසවත් නොබලා ‘ප්‍රේමවන්තයාහටම ධනය හිමිකරමි’ යන පරමාර්ථය පෙරදැරි කොට, ‘කාරයට වෙදැදුරු විසින් කැඳවනු ලැබූ’ සෙන්පතිහට අතදුනි. පෙරවි බමුණානෝද රන්කොතුරුයෙන් සුවඳැත් පහන් සිලිල් (දිය) ඔවුන්අත එව මඞ්ගලහුයින් අඞ්ගුලි වෙඨනයකොට මඞ්ගල පාඨක කියන්ට වන්හ.

වාසල මහනිලමේද සන්නස සහ වැයපත් නිසිලෙස ලියාදක්වී. ඕතොමෝ ඒ පත්‍රයන් කියවාගෙණ අත්සන් තැබීමට සැරසෙන්නී ඔලුව ඔසවා බැලුවාය. එකල ඈ ආලය වැඩූ ප්‍රේමනීය සෙන්පතිහු දූක නියමයලෙස එතුමන්ටම අප්‍රකාශයෙන් කාරය බැඳි පරිදි අවබොධවූ කෙණෙහිම අභ්‍යයකගේ විලාසයක් දරුවාක්මෙන් අෆෝ ආශ්චර්‍ය්‍යමත් ඉන්ද්‍රිය විකලත්වය කට පැමිණියාඅෆ්‍ ප්‍රකෘති සිහියෙන් කටයුතු කරගත නොහී කොමලඟ පොපියවීමෙන් අත තුබූ අනඟ මල්සැරවන් රන් පන්හිඳද බිම වැටී ගියේය. ඉන්පසු සිදුවූ ප්‍රවෘත්තිය පරණ පුස්කොලපොත් හි පෙනෙන පරිද්දෙන්ම දූනගණු ලැබේවා. (මෙතැන්හිදී කාරබන්ධනය සිඩවූ බවද සැලකියයුතු.)

**ආශ්චර්‍ය්‍යමත් සුවසන්විම.**

1

එබව දූන සෙන්ප ති
ලංව මෙන්නා පෙම්ව ති
සිඹ මුහුණ රුසි ර ති
ගැලූ කඳුලෙන් තෙමා ගිනිනැ ති

2

කලාසේ ඈ සි තු
නිවා තුටු බස් කී ම තු
වඩා ඔද පිය ක තු
නැගිට සිටිසා වැළඳ පෙම්ව තු

3

කොම්ල ගත නැලෙ මි ත්
පෙම්වන් වැරදු එකැ මි ත්
බොහෝසේ නැවෙ මි ත්
ලහාමූවන් මරුට ඈය මි ත්

4

පෙර කම් ලෙස මහ ත්
මරණින් මුදනු පෝස ත්
ලැබ වෙද පිළියමු ත්
නොවම සුලුපටු අතේ සිරිම ත්

5

තුඹු වියො ගිනි කඳ ද
වෙසෙසින් නිවීගියලෙ ද
සියොලඟ දරුණු ව ද
වේදනාවෙන් මිදී සිටි ස ද

**වෛද්‍යාචාර්‍ය්‍යාම ත්‍යාග දීම.**

6

වෙදදුරු තුමා වෙ ත
මිල ලබනු දෙක වැය ප ත
පිළිගන්වා අත ත
තුතිද කරගිය සමඟ පෙම්ව ත

මෙපරිද්දෙන් ගුප්ත කාරබන්ධනයට පත් මහ සෙන්පතිහු වෛද්‍යාචාර්‍ය්‍ය තුමාට දීමනා දෙවා මෙන්නා නමැති ප්‍රියකාන්තාව හා සමග යන්ට වත්ත.

මහසෙන්පතිහු අතරමගදී ඈට සිදුවූ අන්තරායයන් නොව ලහා විස්තර කරණලෙස ප්‍රියාව ගෙන් ප්‍රශ්න කළහ. පිළිතුරු වශයෙන් කියනලද ඈගේ කථාව පරණපුස්කොල පොත්හි මෙසේ දක්වනලදී.

**මෙන්නා කලකිරීම.**

1

පොලොන්නරු සැම ද න
ඔබ අගුණ කියමින් ම න
කෙලෙසා සිටි බැවි න
ඔබට ආදර මනකා නැතිවූ න

2

නොසතුටුව සිටි ම ට
තද වද දෙවා විගස ට
ගෙනයන ලෙස එවි ට
මෙඹබ එන බැව් කීහ එකප ට

**මේඝනාගේ පුදුම ගමන්.**

3

එබව සිත ර ද වා
බොහෝ රිය පෙළ ස ද වා
රුදු අසෙක් යො ද වා
තුබූ රිය නැග ගියෙමි සෙ ද වා

4

දූසි දස් සමග තෙ කා
අනුර පුරවර විගසෙ කා
එන සඳෙහි නොව සැ කා
මහා වේ මැද තුබූ වෙස් දූ කා

**අසාවසා කැලඹීම.**

5

අසු බොහොසේ කැල ඹි
සිටි බැව් දූනම ඇඹි ඇ ඹි
පටිය අදිමින් ඔ බි
නොබට කර කර ගියෙද එගි එ බි

**මේඝනා රථයෙන් වැටීම.**

6

අනුර පුර මා බෝ
වෙතෙහි දන කොලහල බෝ
දූක අසු දුර නො බෝ
යන්ට මත්තෙන් එසිරි මා බෝ

7

වෙත සරස පැ න් නා
රිය ගල් වැඹෙක ව න් නා
පසු කිමෙක වෙ න් නා
නොදූනී මා එහි බිමට ව න් නා

**මේඝනා මරණාසන්නවීම.**

8

එකල රිය සුනු වී
ගියේ මට සිහි නැති වී
සිටි සඳෙහි දුක් වී
දසුන් වෙදදුරු ලඟට ගෙන් වී

**ප්‍රධාන කම්මිහනගේ අවවාද.**

9

වෙදදුරුගෙ පිළිය මී
ලබන සඳ මා නොවහි මී
දෙට දූසිය නොතර මී
වේය ආ මේ ගමන ඔබන මී

10

සීව ඇපා තු ම
සව්සිරි සපිරි මනර ම
පඬි යුද ගෙණ ජය ම
අවුන් මහසෙන්පතිවි රට සැ ම

11

එතුමාගෙ සිරි තෙ ද
මකියම් කෙලෙස නතුලෙ ද
බිඳුවන කපට ප ද
අසා ඔබ දූන් රුවටුනාව ද

12

එහිමි නෙද පුවන ර
වෙනත සෙහෙහස නැත හි ර
ඔබහටම පෙම් කා ර
සිටි කීවා එලඳ සැකා හැ ර

**මේඝනාගේ අන්තිම කැමැත්ත.**

13

එ අසා දලි සො වි න්
සිටි සඳ මෙමා මෙලො වි න්
අස්වනු සිතු බැ වි න්
ඔබට දන හිමිකරණු මැන වි න්

14

වෙදදුරුට බස් දී
කොනෙක් කාරය මෙහි දී
සිදු කරණුව යෙ දී
දෙමැයි පන්දහක් කී ෂේ දී

**පුදුම කාර බන්ධනය.**

15

කාරයට මෙඹබ ම
ගෙන්වීය වෙදදුරු තු ම
අසු කැලඹුනු තර ම
හැහෙයි මාවත අසිරි බැලුව ම

මෙත්තා කුමරියගේ මේ කථාවෙන් අයකැමිව සිටි ඇගේ සුලු පියාණන් ප්‍රධානකොට ඇති කපටයන්ගේ කෙටවිලි බසින් රුවටී සෙන්පතිහු වෙත සෙනහ සිඳසිටියදි 'එතුමා ප්‍රභුශක්තියෙන් ඇ ගැණීමට එන්ය'යි නැවතත් කපටයන් කීසෙයින් රියනැග දස දසියන් පිරිවරා අනුරාධපුරවෙත ආ බැව්ද මහමාවත සහ අනුරාධපුර ජන කෝලාහල හෙතුවින් අසූ කැලඹී රථය පෙරළී ඇට අනතුරුවූ බැව්ද ප්‍රධාන කම්මිතතිය ගමනේ දොෂ දක්වමින් සෙන්පතිහුගේ ගුණ කී බැවද ඉන් පැහැද මරණාසන්නයෙහි පෙමවත්හට ම ධනය හිමිකර නැබීමේ පරමාර්ථයෙන් කාරබන්ධනයට නිස්සෙක් වෙදදුරු ලවා මෙහෙයූ බැව්ද වෙදදුරුතුමා තනිය නොදන මහ සෙන්පතිහුම කාරයට සැඳවා ගෙණ ආ බැව්ද ප්‍රකාශවේ.

---

# 7 වෙනි පරිච්ඡේදය.

## මාර්ග වර්ණනාවක්.

"හැහෙයි මාවත අසිරි බැලූවම" යන්නෙන් පැරණි කිවිහු මේ මාර්ගවර්ණනාව කිහු. (මෙය පරණ පුස්කොළ පොත්හි කාව්‍යයන්ගෙන්ම සකස්කරමි. ඇතම් කාව්‍යයන්ගේ ගද්‍යාර්ථයන් දක්නා ලැබෙතත් එහි භාවාර්ථ හෝ පදාර්ථ කීම මේ ප්‍රසථාවේදී උගහට බැවින් ඒ නොයෙදූ බැව්ද නැවත මේ පොත මුද්‍රණය කරන්ට යෙදුන කලක එසේ සන්නයක් යොදන බැව්ද සැලකිය යුතුයි.)

### පොළොන්නරු මහා විහාරය.

1

එකල මහ වාස ල්
පොළොන්නරුසිට සුවිස ල්
*මෙතුවරට මන ක ල්
යනෙනනවේ ලකහණගෙ අතතු ල්

### එහි සල්පිල්.

2

එහි දෙපස සිරි දු ල්
එකසෙ සැදි මහ සල් පි ල්
ගණනනැතා සුවිස ල්
මැදුරැ නැතනැත මහ ළ් දෙමහල්

### එහි මහා ප්‍රාසාද.

3

නෙබුමු සිව් බුමු පා
අතරින් පතර බුමු පා
පස් බුමු සබුමු පා
නැනෙකවි සත්මහල් මහ පා

### සුදුම සෙල්ලම්.

4

නැනෙක බෙරව ය තී
අනෙක කාහල පිඹි ත්
බහුරැ බැඳ නට තී
වියරු වෙස්පා එසත් පිඹි ත්

5

නැනෙක කින්නාර ම්
වයනා හඬද මනර ම්
නෙක පසතුරු ගිගු ම්
ඇසූ අස්රද විය ඉගිලු ම්

---

*අනුරාධ පුරය.

6

තැනෙක වීණා ගෙ ණ
වයති තරුණෝ අපම ණ
තැනෙක කවිරාගෙ ණ
කියති සලෙලෝ එමග හැසිරෙණ

### සුබින්ගේ සෙල්ලම්.

7

තැනෙක ගී සි න් දූ
කියත කණ අම බි න් දූ
සඳලූ තල ප න් දූ
පෙණෙන කෙළිනා රුසිරු ලන් දූ

### බූහු කෙළි.

8

තැනෙක කොලුකැල සි ට
බූහු කෙළි කරති තරගෙ ට
තරුණ කැල එහි සි ට
අනෙක කොලහල කෙරෙති පිටපි

### පැරණි සෙල්ලම්.

9

අං කෙළිද පොල් කෙ ළි
කරණ දන සහ ඔච් ලි
පදින කොලුකැල ය ලි
දෙපස තැන් තැන පෙණෙති
මන කලි

### ඔංචිල්ලා පැදීම.

10

යතුරු උංචි ල් ලා
පදිනු නොවමින් මැ ල් ලා
කියති කවි පෙ ල් ලා
යනෙන දන මන ගණිති අ ල් ලා

### ඇස් බැඳුම්.

11

ගිනි දූල් තුළ බැබ ලි
වදින නොව කිසි සැලකි ලි
කඩු සරඹ මන ක ලි
කැපූ හිසමුත් නැගිට යේ ය ලි

12

දූලියෙන් මසු ර න්
පෙන්වති ඇස් බැඳ න ර න්
නොමදව විදු ද ර න්
ඉදුරු දූලිකෙළි ලෙසිනි අසුර න්

### නා නා සෙල්ලම්.

13

ළී කෙළිද නොව ගී ම්
කළගෙඩි පිඹිනි මනර ම්
රබන් බෙර තාල ම්
උඩැක්කිද කී නොකී සෙල්ල ම්

### සෙල්ලම් කරණ මනුෂ්‍ය වර්ග.

14

කරණ ඔලි පලි රෙ ඩි
බමුණු සිංහල යොන් ප ඩි
උර්දු බංගලි හැ ඩි
දෙමළ ආඩිද යොළි පටට ඩි

15

මරාටි කන්න ඩි
චීන කාපිරි ඇ ඳ ඩි
සිතින දන නොම කැ ඩි
රකිති වේ මග හැසිර බඩගෙ ඩි

### ගමමකිෂ අශව ඝන සාවයෝ.

16

තැනෙක ගව න ප් පූ
ලන රග ලෙසට වෙ ප් පූ
අසූ හට කුල ප් පූ
මියුහු දුවති වෙමින් බ ප් පූ

### හාත්තු.

17

තැනෙක ගිරි පෙළ සේ
ඇත් කඳ සරති වෙසෙ සේ
මෙමග වැද රිසි සේ
යෙද්ද රිය පැද කනෙක් කෙලෙසෙ

### අනුරාධපුර පිවිසීම·

18

මග තැන් තැන තිබු ණු
කොලහල බියෙන් නික්මු ණු
අසු අනුර පුර ව ණු
කලට එහි සැටි මෙලෙස සලකණු

## 8 වෙනි පරිච්ඡේදය.

### නගර වර්ණනාවක්.

"එහි සැටි මෙලෙස සලකනු" යන්නෙන් අනුරාධපුර අලංකාරය ආරම්භකලෙෝ. (මෙහිද දුෂ්කරාවබෝධ පද්‍යස්ථාන බහුලය. පොත නැවත මුද්‍රණය කරනකල ඒ සියලු තන්හි විස්තරාර්ථ දක්වා සන්න සහිතව පළකරණ බව සැලකිය යුතුයි.)

### *අනුරාධ පුරය.

1

වෙසෙසින් සිරින් ස ර
අනුරා පුරය මනහ ර
සිව් මුනිඳු පව ර
පිහිටියෙන් වී දියත පිවිතු ර

### එහි ප්‍රාකාර.

2

මහසෑතන් වෙහෙ ර
වඩිනුව පැමිණි වටක ර
හෙල නායිඳුන් පත ර
දරණ පෙළවැනි පවුරු පුරව ර

### එහි දාගැප්.

3

කෙලෙස් කුළු වටක ළ
හිමවතල ගිරි කුළු පෙ ළ
වැනි මහසෑ ලක ළ
වීය දාගැප් අනෙක පෙළ පෙ ළ

### ශ්‍රී මහා බොධිය.

4

සුරනරනා තොම ද
දෙලෝ සැපදෙන සිතුලෙ ද
කප්තු රුවන් එ සො ද
සසිරි මාබෝ සපිරිවර ල ද

### සාධි ප්‍රාතිහාර්‍ය.

5

මහණ මෙහෙණින් ව ර
සෙව්නා සහස් නෙවෙහෙ ර
ඉදු පෙළහර අසි ර
කුමට බඹ සුර සැපත් එමව ර

6

පහ මු දුනැ සු ලක ල
රන් කොත් කැළුම් මන ක ල
නුබ වඩින අරි කැ ල
සිව්රු පැහැ පුර උදුලවන ක ල

7

රන්වන්වී දස ත
මහමෙර අවට නොනැව ත
විදුලි සුවහස් ප ත
විලස කැල්මෙන් අසිරි බබල ත

### මහා ප්‍රාසාද.

8

දෙමහල් තුන්මහ ල්
ඇ තුගු පහා සිරි දු ල්
නව සුවහස් ලක ල්
මෙපුර සරිකොද පුරෙක් දියතුල්

### භූමිකා ප්‍රාසාද.

9

බිම් මහල් පෙළ පෙ ළු
අනූ සුවහස් සුලක ළු
තුන් ලෝ වෙසෙස ක ළු
මෙපුර මිහිකත් මුවසෙ මනක ළු

* පරණ පුස්කොල පොත්හි.

### නගරාලඞ්කාර.

10

රන් රිදී කුඹු පෙ ළි  
තැන් තැන සැදූ මන ක ල  
රන් රිදී වැට පෙ ළි  
අනෙක දඬුවැට පහන් නැගු දු ල

### ධ්වජපතාක.

11

නැගු දද කෙහෙලි කැ ල  
රන් රිදීයෙන් මන ක ල  
මහ වේ පුර මුලු ල  
සුරන් සැදි රඟ මුනිඳු පුද ලො ල

### රන් තොරන්.

12

රන් රුවන් කල දෝ  
සුවහස් තොරන් එසො දෝ  
දෙපස දිලි වැද දෝ  
වණති සපුරා කවර කිවි දෝ

### නගර වීථි.

13

මහ වැලිඳ සඳව ක්  
මහවේ ඈ සිගුරුව ක්  
පෙළි පෙළි සැදි ලෙස ක්  
කොවේ මාවේ වොරජනා නෙ ක්

### ජනගහණය.

14

දනරැස් පිරි පව ර  
සව්සිරි සපැත් මෙනුව ර  
අලකමඳ නම් පු ර  
නොසරි කොතනැත මෙලෙස  
වෙන පු ර

### හස්ති සහ රථ පඞ්ක්තිහු.

15

ගජ සෙනග ගිරි පෙ ළි  
ගමන් ගත් යුරු පුර තු ළි  
රිය රන් කම් ළදු ළ  
පමණ නැත රැ දෙවෙගී කොලහල

### අශ්වයෝ.

16

පුර සපැත් සමුදු ර  
පෙළි සැදි ළුවන රළි යු ර  
තුරඟ සෙන් මන හ ර  
පමණ නැත යන ගමන් වා ස ර

### නෘත්‍ය මණ්ඩල.

17

බරත සිප් මොනව ට  
හසල නළුගණ හැමවි ට  
රඟ දෙන අම රඟ ට  
රැඟුම් හල් සැදි නුවන් එක්කොට

### නගර ඝොෂාව.

18

රඟ මඬුලු බෙර න ද  
වෙහෙර ඝුළි සැම තුරු න ද  
ගජ තුරඟ රිය න ද  
නිතර ගුම්ගති යුගනැ සිදු ලෙ ද

### ප්‍රතිමා මන්දිර.

19

වෙහෙර වෙතැ එකි නෙ කි  
දිව මනු බුදුහු විලසෙ කි  
බුදු රූ ඈසට දැ කි  
පමණ පැහැදෙන තරම් වෙසෙසෙ

### නා නා විහාරඞ්ග.

20

නෙක පිළිම මැදු රු  
සක් මන් හල්ද අපු රූ  
දව රැ වටන් රූ  
එපුර රජ මහ පහද සොඳු රූ

### වතු ගෙවතු.

21

මහ මේ ඈ දිමුත් ත්  
වතු ගෙවතු පෙළ පෙළි යු ත්  
නඳුනුයන් පරද ත්  
මෙපුර දැක දැක සුමට වෙනව ත්

**පිරිවෙන්.**

22

තෙවළා මහණ වෙන්
තෙර පත් තෙර නැණ නැවෙන්
සතර බණ වෙන් වෙන්
උගණු තැන තැන වීය පිරිවෙන්

**මහ පොකුණු.**

23

නිමල දිය පැහැ දිය
පියගැට පෙළින් වොරැ දිය
තැන තැන මත බැ දිය
පොකුණු මෙලෙසට කොතැන්
ඇත දිය

**වර්ණනා විෂයාතික්‍රාන්ත නගරශ්‍රී.**

24

දියත හැම සිරි බර
සැපත එකතැන තුබූ යුර
වණත බැරි කිවියර
සමත මදවෙණු අනත ගණී සුර

---

## 9 වෙනි පරිච්ඡේදය.

**ශිව සහ මේනකා.**

මෙත්තා කුමරිය ප්‍රේමවන්තයාගේ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් අශ්වයා කැලඹුනු ආකාරය දක්වීම සඳහා ගමන්කළ පොළොන්නරු වීථියෙහිද අනුරාධපුර (නගර) යෙහිද විස්තර දක්වූ පරිදි (පරණ පුස්කොළ පොත්හි පෙනෙන ලෙසම) යට සඳහන්වූයේය.

මහා සේනාධිපති තෙමේ ප්‍රිය සුන්දරියගේ මේ කථාව අසා පොළොන්නරු වාසීන් තමන්ට කරණලද අනාථය මෙනෙහිකොට ඒ කපටයන්ට ස්වකීය පුරුෂබල පරාක්‍රමය පෙන්වන්නාක් මෙන් මහෝත්සවයෙන් විවාහමඞ්ගල්‍යය සිඬකිරීමට කටයුතු පිළියෙළ කළහ.

හෙතෙමේ ප්‍රථම කොට සේන මහරජාණන්ටද ස්වකීය මිත්‍ර පියතිස්සට සහ බාල්‍යයෙහි පෙම් බැඳ සිටි විමලාටද අවශේෂ සියලු බන්ධු මිත්‍රයන්ටද හසුන්පත් යවා එකලට මෙත්තා නිවැසි ස්වකීය ජ්‍යෙෂ්ඨ නැන්දනියගේ ඒ මහත්වූ පඤ්ච භූමක ප්‍රාසාදය දිව්‍ය භවනයක් මෙන් අලංකාර කරණලදහ.

---

**විවාහ මඞ්ගල්‍යය.**

සෙනාධිපතිහුගේ මඞ්ගල්‍යාරම්භනා දක්වන
(පුස්කොළපොත්හි) කවි දෙකක්.

**පියතිස්සම.**

1 ත මා හට ඔබා දුන් ගුණ ව තා ඉ තා
පෙමා දරැති පියතිස්සට මෙනා සු තා
ස මා වෙමිනි එනු මැන දෙස් ඇ තා නැතා
අ මා වදන් ලිපිකර යැවි සි තා ම තා

## විමලාව.

2 අ ටී වඩන රූ යුත් සිරි — ක ලා තු ලා
සි ටී ශිවිස සරණෙට එවි — ම ලා ලො ලා
සැ ටී එන සිටිමු අපි මග — බ ලා බ ලා
තු ටී නැන වෙත ලී නොව — ක ලා පි ලා

සෙන්පති මෙසේ සියලු කර්තව්‍යයන් නිමවා ප්‍රීතියෙන් සිටියදී යථොක්ත අවශ්‍ය බන්ධුවරයන්ද මහරජාණන් සහ මෙහෙසියන්ද අවශෙෂ සියදහස් ගණන් බන්ධු මිත්‍රයන්ද එහි පැමිණ මඞ්ගල්‍ය භොජනයෙන් සඞ්ග්‍රහ ලබා ප්‍රීති උත්සව පවත්වන ලදහ. එහි විස්තර දක්වන (පුස්කොල පොත්හි) ඇතම් කවි මෙසේයි.

## මහරජුගේ පැමිණීම.

3 එ ඳා බිසෝ සමගින් සෙන් — ර ඳා සොඳා
යො ඳා දසතුරඟ රිය නැග — ස ඳා ස ඳා
න ඳා කළු අසිරි ගනඳුරු — සි ඳා බි ඳා
වි ඳා දිසි කැළුම් තෙද දින — ර ඳා ලෙ ඳා

## විමලා සහ පියතිස්ස සමග
## සුමන ආදිපාදයාණන්ගේ පැමිණීම.

4 ඇ පා යෙහෙළි පියතිස්සද — ස මා ග මා
බ්‍රි පා පැමිණී පසු එහි වැද — අ මා පෙමා
නා පා වික්‍රම් බල සෙන්පති — තු මා සැ මා
දී පා සිරින් බබලනු සිතූ — ක මා කි මා

## විමලාගේ චිත්තසන්තාපය.

5 ෂා පා සිත් ලදුන් වෙතැ වැඩි — වෙ නා මෙ නා
බ්‍රි පා සමග මෙහෙසින් සිටි — තැ නා පි නා
ඈ පා ලඟම සිටි මෙත්නා — දූ නා දි නා
නා පා වනී විමලා සිතූ — ම නා ගු නා

මේ මහාසභාවෙහිදී මහසෙන්පතිහු පියතිස්සට
ස්තුතිකොට කරණලද

## ව්‍යස්ත කථාව.

6 නි රි ඳු පියහු සැම මිතු සබඳු අබි — මු ව
ප සි ඳු සෙනෙවිරද සිටි විලස පළු — මූ ව
සු මු ඳු බසින කියමිනි ඔවදන යො — මු ව
මෙබ ඳු යසස ලැබුවෙම් මිතුරිඳු පු — මු ව

7 ම සි තු ව ඬ න ගුණ තැණ පිරි පියති ස් ස
මෙ කි තු ල බ න ඔවදන දුනි නිසි නි ස් ස
ෂැ ව තු තොමින දුසිරිත මගහැරි ද ස් ස
ෂ ව තු සි රි න සියවස මිතු ලෙස රි ස් ස

8 මෙ ලෙස තුති දෙමින මිතුරුට පිය ති ස් ස
වෙ සෙ ස මගුල බබලව මිති කිතු රු ස් ස
ස තො ස මහරු බොජුනනුබව කර ති ස් ස
නෙදෙ ස විසිර ගිය එහි සැම දන රු ස් ස

## මෙත්තා කුමරියගේ කථාවක්.

9 සේ න නිරිඳු වැඩි සඳ සුමගුල් ප සු ව
මා න ගුණ වඩන සෙන්පති ලද එ සු ව
පා න ලෙස පියගු වෙන පියඹු පැව සු ව
පී න මින සතුටු සයුරෙහි සැම වි සු ව

ඒ මෙත්තා කුමරියවූ කලි සමුණන්ද වෙත තුනීකරණලද සෙනහය ප්‍රධාන කම්මත්තිය බසින් නැවත වැඩූ බැවින්ද මෙසා චිත්ත ප්‍රීතියට ඇගේම බස මරණාසන්නයෙහිදී ප්‍රතිඥාධාරව "නියම ප්‍රේමයෙන් ජනිත කර්ම විපාකයාගේ ආනුභාවයෙන්දෝ" මරණයෙන්ද වැලකී නිරායාසයෙන්ම අභිමතාර්ථ සාධකවූ බැවින්ද ඒ ජ්‍යෙෂ්ඨදූසිය මචිතනතුරේ තබා රක්‍ෂාකළාය. ඔතොමෝ ඒ බව ප්‍රකාශකරන්නී උදාරවූ ප්‍රීති වාක්‍යයන්ගෙන් ඇ සිතු පිනවා ඇට මසුරන් දහසක්ද සතුටුපඬුරු පිණිස දුන්නීය.

මේ බව දත් මහ සෙන්පතිහුද කෘතඥ භාවයෙන් යුක්තවූවාහු මසකට මසුරන් පසෙක් බැගින් දිවිහිමියෙන් වැටුප් නියමකොට අත්‍යාදරයෙන් ඒ කම්මත්තියට සඞ්ග්‍රහ කළහ

පසුව සෙන්පතිහු පියාණන්ගෙන් අවසරගෙණ ප්‍රියාඞ්කාවන් හා එක්ව රජවාසලට ගොස් මහරජු බැහැදක සිටිසඳ එරජ දුන් අපමණ පඬුරු පාක්කුඩම් පිළිගෙණ ඉතා ප්‍රීතියෙන් ස්වකීය නිවාසයට ප්‍රවිෂ්ටවූහ. ඒ අභිනව යුවල යසසිරින් පිනපිනා දැහැමින් කල්ගතකරන්නාහු පියතිස්සය විමලාය යන අවශ්‍ය බන්ධූන් බෙරමිණිපා යවා පියාණන්ට බෙහෙවින්ම සඞ්ග්‍රහකරමින් අනඟසිරි සරින් වැස ප්‍රීතියෙන් ප්‍රීතියටම පැමිණියහ.

යළිත් මහසෙන්පතිහු ප්‍රියදෙහිණිය සහ පියාණන් හා සමග බෙරමිණිපා ගොස් එහි ඇති පියසන්තකවූ කෙළගණන් ධනය දශීනය කරවීමෙන් ප්‍රියාව සතුටුකරවා පෙරළා පොළොන්නරු පුර අවුත් දිවිහිමියෙන් සේන මහරජුන් ආශ්‍රයකොට අඬාවූ පිය තුමන් සහ ප්‍රිය භාර්‍ය්‍යාවන් රක්‍ෂාකළහ.

මේ අදහස් ප්‍රකාශිත (පරණ පුස්කොළපොත්හි) ඇතැම් කාව්‍ය මෙසේයි:—

### රාජ දර්ශනය.

10 නුවර වාසලට වැද පියඹු සෙන් ප තී
එවර නිරිඳු බැහැදක එනතෙක් පෙමැ තී
පවර පියතුමන් අවසර ගෙණ කැම තී
ලකර සිරින් ගිය එම යුවල පිත් ඇ තී

### සිතාශාපසථාක.

11 නිරිඳු සගහ ලැබමින් දෙදෙනා ආප සු
සබඳු දෙදෙනා බෙරමිණිපා යවා ප සු
පුරුදු අහර සැම කිස යොදවා පහ සු
සුරිඳු ලෙසට ඇපා පියතුම සැල සු

### මෙත්තා බෙරමිණිපා පිවිසීම.

12 සමග සිව පියතුම සහ පියඹු ලො ල
අනග සිරිනි බෙරමිණිපා ගොසින් දු ල
නෙවග රුවත් මිණි මුතු පියදන ලක ල
පියග ණපා සිතු පිනවී සිරි සිය ල

### සුමන ආදිපාදයාණන් ජනමාගනරගතවීම.

13 මෙසේ කලක් වසමින් බෙර මිණි පාය
නොසේ පොළොන්නරු පුර වැද මහ පාය
ලසේ තොවී තෙරුවන් කර පිනි පාය
යසේ සග සැපත ලද එම ඇ පාය

### සිව සහ මෙත්තාගේ ප්‍රියවාසය.

14 සීව පියඹු සමගින් වැස නුරා පුරා
පැව නොනිම් තෙද කිතු දිනි සුරා සුරා
බෝව උතුම් යුව රද සිරි දරා තිරා
පේව කුසල් කෙලෙ පසු සිතු පුරා සරා

මෙසිරිලක එසිරිකල සුසිරිනෙහි අසිරි පැ 'යොවුනන් මන නෙමන'
සිව ඇපා සිරිත මෙපමණින් නිමියේය.

# 10 වෙනි පරිච්ඡේදය.

## අභිනව ග්‍රන්ථ කර්තෘ.

1 න ම ක් කිසිත් නැති පුස්කොල පොත් පො ඩි ය
ව ර ක් දූක මිතුරු ජයසෙන් ඔදවැ ඩි ය
ම ල ක් විලස ගරුකොට ගෙණවුත් එ ඩි ය
උ ද ක් ම කළ අයැදුම තිර විය වැ ඩි ය

2 ඩී. ඇ ස් ජයසේකරය නමැති ගත් ක රු
නල් ග ස් වැවට යන සඳ රැකා මග අතු රු
විස් ව ස් කමට දී පුස්කොල පොත මහ රු
ඇප් දෙස් බසින් පළකරණට කී සොඳු රු

## ග්‍රන්ථාභ්‍යාසය.

3 එ ජ ය සේන මිතුරිඳු කළ සඳ යැදු ම
සු බ ය කියා සිතුනෙන් ලකට මන ර ම
අ ග ය පෙර සිරිත හෙළ දන වෙන පෑ ම
ලෙ ස ය මෙපොත පළකළෙ දූනගණු සැවො ම

## ග්‍රන්ථ සමාප්ත කාලය.

4 දෙ ද හ ස් සාරසිය එක් පණස මුනි ව ස
රි වි රැ ස් තුලා පස් විසි වන් සිය දව ස
සොම්ම ස් විසේනිය ඉල් පුර පත් එලෙ ස
සහතොස් මෙපුස්කොල පොත පළකෙළෙමි ය ස

## පරමාර්ථ පරීක්ෂණය.

5 ක ම ලා ලියසෙ කොමලව රුසිරු සි ලි සි ලි
වි ම ලා ළඳට පැහැදී සිටිය ඇ ලි ඇ ලි
එ කා ලා පියතිස්ස කළ සුසිරි බැ ලි බැ ලි
නුමු ලා සැවොම ගිවිසුම් රකින නි ළි නි ළි

6 මෙ ක ල් කුරිරු ගුණමකුවන් දුසිරි න ය
අ වු ල් කරන ගිවිසුම් සිඳැර ඉව න ය
එ ක ල් පියතිස්ස තනු දකු ඉන සි න ය
රු කු ල් නොතිබු රඟ වන්නෙමය මචි න ය

7 අ නු න් ස ම ග ගිවිසුම් ඇතිකර සි ටි ය
යොවු න් අ න ග සිරිදූරි විමලා සැ ටි ය
නොද න් න, ර ග උන් කුමරහු කිතු කැ ටි ය
ස ද න් න, ළ ග ගැටවර සැවොම බුහු ටි ය

8 ත ම න් සතුටු මුත් ගිවිසුම ලෙස කුම ඊ
අ නු න් හටම හිමිවනු කිස කළ නොහැ ඊ
අ නු න් මාරුවෙහි සොරු වෙසෙස දුක දෑ ඊ
යොවුන් පියතිස්ස මිතු දම් රැකි අසි ඊ

9 සී ව සරණයට ගිවිසුම් දී සි ටි ය
පැ ව සුපුන් සඳ යුරු වත වැඩූ අ ටි ය
ජේව උන් කුමරි සහ පියදන කෑ ටි ය
පා ව දුන් අසිරි බල මිතුරුට ති ටි ය

10 සො බ න රුසිරු දූරු මෙත්තා කුමරි අ නේ
ම ර න ලංව පෙම්චිත්හටම පෑසෙ නේ
බ ළ න කලට කුල අඟණන් සිතට වි නේ
බැ ති න සැමිහු සලකනු සිංහල කතු නේ

**ඉෂ්ටාශිංසනය.**

11 පෙ ර සි රි ත ට යොවුනන් සිතු කතු වේ වා
ප ර සි රි ත ට අඟණුන් තුටු නොම වේ වා
ති ර චි කු ම ට හෙළදන නිති පත් වේ වා
මෙ ර හිමකොට සියවග සිරි අත් වේ වා

**නිමි.**

දූනට සඞ්ග්‍රහකරගෙණ යන **'මාසම'** නමැති අනික් රසවත් කථාව කියවීමට සතුටුද?